Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ව්‍යාවර්තන හා මැදිහත්වීම් ක්‍රියාවලි සැලසුම් කිරීම

(Thania Paffenholz)



1. හැඳින්වීම 193

2. මහා මැදිහත්වීම් සැලැස්මක් සඳහා කොන්දේසි සහ පරාමිතීන් 195

දෘෂ්ටි, ඉලක්ක සහ සැලසීම 195

ගැටුම් සහ ක්‍රියාධරයින් විශ්ලේෂණය කිරීම 197

උපක්‍රම සහ කාර්යභාර 201

නිසි හවුල්කරුවන් සහ ප්‍රවේශ ස්ථාන සොයාගැනීම 202

කාලය නිර්ණය කිරීම, දීර්ඝ කාලීන තිරසාරත්වය සහ ප්‍රශ්න දොරටුවල අවශ්‍යතාවය. 204

ක්‍රියාවලි මෙහෙය කිරීම සහ ව්‍යුහයන් ගොඩනැගීම 207

නිසි පුද්ගලයන් තෝරා ගැනීම සුදුසුකම්වලට එරෙහි සැලසීම 208

සහයෝගීතාව සහ සම්බන්ධීකරණය : සාමය ගොඩනැගුම් සඳහා 210
මහජාතික සන්ධාන සලකා ගැනීම

ක්‍රියාවලිය තිරසාර බවට කිරීම 212

ඉගෙනුම් යාන්ත්‍රණ ඇතුළත් කර ගැනීම 213

3. ඉදිරියේ ඇති අවිනිශ්චිත ප්‍රශ්න සහ අභියෝග 214

4. ආශ්‍රිත ලේඛන සහ වැඩිදුර කියවීම 215

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ව්‍යාවර්තන හා මැදිහත්වීම් ක්‍රියාවලි සැලසුම් කිරීම

ටානියා පැෆන්හෝල්ස් (Thania Paffenholz)

## 1. හැඳින්වීම

මැදිහත්වීමේ ක්‍රියාවලි සැලසුම් කිරීමේ දී පොදුවේ මුහුණ දෙන ප්‍රශ්න බහුතරයක් මූලික වශයෙන් එක් ප්‍රශ්නයක් කේන්ද්‍ර කරගනී. "කුමන ක්‍රියාධරයකුට, කුමන උපාය හා මෙවලම් මගින්, කුමන අවස්ථාවේ දී ගැටුමේ නිශ්චිත තත්ත්වයකදී මැදිහත්විය හැකිද" යන්න එයයි. උගතුන් සහ වෘත්තිකයන් මැදිහත්වීමේ රාමුවක් පෙන්නුම් කරන තනි පිටුවේ රූප සටහන් අච්චුවක් යොදා ගනිමින් මේ ප්‍රශ්නයට පිළිතුරු සපයන්නට උත්සාහ කොට ඇත.

යථාර්ථය වෙනස්ය. අර්බුද ක්ෂේත්‍රවලදී අනෙක් මැදිහත්වීම් මෙන්ම සාම මැදිහත්වීම් ද බහුවිධ ක්‍රියාධරයින් විසින් සමස්ත අච්චුවක් මගින් සැලසුම් කරනු ලබනවා නොව, සාමාන්‍යයෙන් තනි ක්‍රියාධරයකු විසින් සහජ හැකියාවෙන් හෝ පළ පුරුද්දෙන් සැලසුම් කෙරේ. එබැවින්, මැදිහත්වීමේ හැකියාවන් නිශ්චිත ගැටුම් තත්ත්වයක් සම්බන්ධයෙන් මැදිහත්වන ක්‍රියාධරයින්ගේ විකල්පයන් සහ සීමාවන්ට ඍජුවම සම්බන්ධ වේ.



මැදිහත්වීමේ උපායයන්, ප්‍රවේශන ස්ථාන, සම්බන්ධීකරණය වැනි කාරණා සැබවින්ම විවිධ අන්දමට ක්‍රියාත්මක කෙරේ. ක්‍රියාධරයින් නිවැරදි උපායයන් හෝ මෙවලම් මොනවාද කියා හෝ ප්‍රශ්න කරන්නේ කලාතුරකිනි. ඔවුහු තමන්ගේම වූ පෙර-නිමිති මැදිහත්වීමේ සැලසුම් තනාගෙන සිටිති. උදාහරණයක් වශයෙන් උගත්තු ප්‍රශ්න විසඳීමේ වැඩමුළු හෝ මැදිහත්වීමේ පුහුණු වැඩසටහන් වැනි මෙවලම් ගැන යෝජනා කිරීමට පෙළඹෙති. සංවර්ධන ආයතන ගැටුමේ මූල හේතු ගැන කටයුතු කිරීමේ ව්‍යාපෘති ආරම්භ කරති; ජනමාධ්‍යවේදීහු මාධ්‍ය වැඩසටහන්වලට සහාය දෙති. රාජ්‍යමය පථ 1 හි ක්‍රියාධරයෝ අනුග්‍රාහක සේවා, පහසුකම් හෝ මැදිහත්වීම් සපයති. මැදිහත්වීමේ ක්‍රියාධරයින් සැපයුම් පසෙහි සිට තම තමන්ගේ විශේෂිත 'නිෂ්පාදන' ඉදිරිපත් කරන වෙළෙඳපොළ තත්ත්වයක් ගැන කතා කිරීම වඩා නිවැරැදිය. මෙම මෙවලම් සැපයුම ඉල්ලුමට වඩා බොහෝ සෙයින් ඉදිරියෙන් සිටින තරමට පොහොසත්ය.

ප්‍රවේශ ස්ථාන ප්‍රායෝගිකව බලන විට නිශ්චිත තොරතුරුවලට වඩා අඩුවෙන් සාකච්ඡා කෙරෙන දේ වෙයි. ගැටුම් ක්‍රියාධරයින් විවිධ වූ ජන්ද ජන කොට්ඨාසයන් වෙතින් මතු වී එන අතර, ස්වභාවයෙන්ම අර්බුද කාලවලදී, තමන්ගේ ජන්ද කොට්ඨාසයට සහාය දෙති: සාම ක්‍රියාධරයෝ ප්‍රාදේශීය සාම කණ්ඩායම්වලට සහාය දෙති; දේවස්ථාන සංවිධාන ඔවුන්ගේ ප්‍රාදේශීය දේවස්ථානවලට උපකාර කරයි. මැද පෙරදිග ප්‍රශ්නයට නෝර්වීජියානු මැදිහත්වීම මෙන් මැදිහත්වීම අහම්බෙන් ද සිදුවිය හැකිය. මැද පෙරදිග ප්‍රශ්නයේදී නෝර්වීජියානු පර්යේෂණ ව්‍යාපෘතියකට දෙපාර්ශවයේම නායකත්ව මට්ටම සමග සබඳතා පැවැත්වීමට හැකි වූ අතර, පර්යේෂකයින්ගෙන් එක් අයෙකු නෝර්වීජියන් විදේශ ඇමතිවරයාගේ බිරිඳ වූයෙන් එම ඇමතිවරයා (පථ I) රාජ්‍ය මට්ටමින් සාකච්ඡා ආරම්භ කළේය.

පොදුවේ ගත් කල සම්බන්ධීකරණය න්‍යායාත්මක පසට නැඹුරු වෙයි. මැදිහත්වන සෑම ක්‍රියාධරයකුම සම්බන්ධීකරණය අවශ්‍ය වන නමුදු කිසිවකුට හෝ සම්බන්ධීකරණය කරනු ලැබීමට අවශ්‍ය නැත! අනෙකුත් ක්‍රියාධරයින් සමග තොරතුරු බෙදා හදා ගැනීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම සංවේදී වන්නාවූ ද, ගැටුම් ව්‍යාවර්තනය සහ සාමය ගොඩනැගීමේ සමස්ත අරමුණ සමග සමහරවිට නොගැළපෙන ආත්මාර්ථකාමී ඕනෑ එපාකම් ඇත්තා වූද සාම මැදිහත්කරුවන්ට මෙය විශේෂයෙන්ම ගැළපේ.

එහෙත් සැක සාංකා පසෙක තිබියදී, පසුගිය දස වසර තුළ උගතුන් සහ වෘත්තිකයින් යන දෙපිරිසම විවිධ වූ බොහෝ සාම මැදිහත්වීම් මගින් බොහෝ දේ උගෙන ඇත. ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍රයේදී මැදිහත්වීම සඳහා වූ කොන්දේසි බවට පත්වන පාඩම් මාලාවක් කෙරෙහි කතුවරයා මෙම පරිච්ඡේදයේ දී අවධානය යොමු කරයි. මැදිහත්වීමේ උපායයන් ක්‍රියාධරයාගෙන් ක්‍රියාධරයාට වෙනස් වන නිසා, මෙම පරිච්ඡේදයෙන් හඳුන්වා දෙනු ලැබ, විශ්ලේෂණය කෙරෙන පරාමිතීන් සහ කොන්දේසි මූලික වශයෙන් ගැටුම් විසඳීමේ රාජ්‍ය නොවන සංවිධාන හෝ ප්‍රායෝගික ක්‍රියා මුල්කරගත් පර්යේෂණ ආයතන වැනි රාජ්‍ය නොවන ක්‍රියාධරයින් සම්බන්ධයෙන් වන බව සැලකිය යුතුය. එසේ වුවද, බොහෝ පරාමිතීන් මැදිහත් වන අනෙකුත් ක්‍රියාධරයින් හට ද වැදගත්වනු ඇත.

මැදිහත්වන බාහිර ක්‍රියාධරයින්ගේ කාර්යභාරය ගැටුම් කලාපය තුළ සිටින ක්‍රියාධරයින්ට සහය වීමය යන්න සැලකිල්ලට ගනිමින් මෙම පරිච්ඡේදය පුරවැසි සාම මැදිහත්වීම් බාහිර වශයෙන් සැලසුම් කිරීමේදී යොදාගනු ලබන ප්‍රවේශ සහ මෙවලම් ගණනාවක් ඉදිරිපත් කරයි. *සාර්ව (macro) (ඉහළ මට්ටමේ) මධ්‍යම (meso) (මැදි මට්ටමේ) සූක්ෂම (micro) (පහළ මට්ටමේ)* යන මැදිහත්වීමේ මට්ටම් තුන සම්බන්ධයෙන් කතුවරයා වැදගත් කාරණා දහයක් සාකච්ඡා කරයි: දැක්මක් සඳහා අවශ්‍යතාව, ඉලක්ක සහ කැපවීම; ගැටුම් සහ ක්‍රියාධරයින් පිළිබඳ විග්‍රහ කිරීමේ ක්‍රමය; උපායයන් සහ මැදිහත්වන ක්‍රියාධරයින්ගේ කාර්යභාරය; නිසි හවුල්කරුවන් සහ ප්‍රවේශන ස්ථාන සඳහා වූ අඛණ්ඩ සෙවිල්ල; මැදිහත්වීම් කාලය නිශ්චය කිරීම; ක්‍රියාවලි ඔස්සේ සිතීම සහ ව්‍යුහයන් ගොඩනැංවීම; ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා නිර්ණායකයන්: සම්බන්ධීකරණය සහ සහයෝගීතාව; කල්පැවැත්මේ අරමුණු සහ අධ්‍යාපනය ගොඩනැගීම යන කාරණා මැදිහත්වීමේ ක්‍රියාවලිය තුළට ඇතුළත් කර ගැනීම යන්න ඒවාය. 

මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති මැදිහත්වීම් සඳහා වූ කොන්දේසි පෙළ කතුවරයාගේ ප්‍රායෝගික ක්ෂේත්‍ර අත්දැකීම් සහ එම සාහිත්‍යය පිළිබඳ අන්තර්ඥානය මෙන්ම *Peace Building: A Field Guide (Paffenholz and Reychler 2000)* නම් අත්පොතේ සහ ලයිෆ් ඇන්ඩ් පීස් ඉන්ස්ටිටියුට් හි (LPI) සෝමාලියාවේ සාමය ගොඩනැගීමේ කාර්යය (Paffenholz 2001) පිළිබඳ අධ්‍යයනයේ පාඩම්ද සංස්ලේෂණය කොට දක්වයි.

## 2. මනා මැදිහත්වීමේ සැලැස්මක් සඳහා කොන්දේසි සහ පරාමිතීන්

### 2.1 දෘෂ්ටි, ඉලක්ක සහ කැපවීම

වෘත්තිකයන් ගැටුම් ව්‍යාවර්තන/ මැදිහත්වීම් උපායයන් ගොඩනගා ගන්නට උත්සාහ කරන්නට පෙර, මැදිහත්වීම සඳහා වූ ප්‍රකාශිත අපේක්ෂා සහ අවශ්‍යතා තහවුරු කරමින්, පාදක දෘෂ්ටිය දෙස සමීප බැල්මක් හෙළන ලෙස ඔවුන්ට උපදෙස් ලැබිය යුතුය. මැදිහත්වීමේ දී ක්‍රියාධරයින් තුළ සාමකාමී

විසඳුමක් පිළිබඳ පැහැදිලි දෘෂටියක් නැති විට සාමාන්‍යයෙන් ඔවුන්ගේ මැදිහත්වීම ඉල්ලුම් පාර්ශවය මගින් හෝ ගැටුම් කලාපයේ අවශ්‍යතා මගින් තීරණය කෙරෙනවාට වඩා සැපයුම් කරුවන්ගේ වෙළෙඳපොළ මගින් තීරණය වීමේ අනතුරක් ඇත. සාමය සහ ගැටුම් ව්‍යාවර්තනය සඳහා වූ සැබෑ කැපවීම අනුව ක්‍රියා කිරීම නිසා මැදිහත්වීම මගින් තනතුරු අවම කරන්නා වූ ද අවසානයේදී නිර්මාණාත්මක ගැටුම් පරිවර්තනයකට මග පාදන ඵලදායී ක්‍රියාවලියනට උපකාරී වන්නා වූ ද අවස්ථා වැඩි කෙරෙයි.

එහෙත්, දෘෂ්ටිය පමණක් ප්‍රමාණවත් නොවේ: මැදිහත්වන ක්‍රියාධරයින් තමන්ගේ දෘෂ්ටීන්, ඵලදායී මැදිහත්වීමේ උපායයන් වැඩි දියුණු කර ගැනීම සඳහා වූ පදනමක් සකස් කළ හැකි, ක්‍රියාකාරී වූද දිනාගත හැකි වූද ඉලක්ක බවට පත් කරගත යුතුය. ගැටුම් ව්‍යාවර්තනය සඳහා අදාළ ප්‍රශ්න සහ අවශ්‍යතා වෙනුවෙන් යොදන ලද ක්‍රියාධරයාගේ/ ආයතනයේ හැකියා සහ සීමා, වටිනාකම් සහ ඵල ප්‍රයෝජන විශ්ලේෂණය කිරීම මගින් ඉලක්ක ඉතා හොඳින් පැහැදිලි කළ හැකිය. ඉලක්ක පැහැදිලි විය යුතු අතර, මෙම ඉලක්ක වෙත ළඟාවීම සඳහා යොදාගන්නා උපායයන් වෙනස්විය හැකිවා සේම, ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලියේදී මෙම උපායයන් බොහෝ දුරට අනුවර්තනය කර ගැනීම හෝ නවීකරණය කර ගැනීමට ඉඩ ඇත.

උදාහරණයක් වශයෙන්, සෝමාලියාවේ සාම ක්‍රියාවලිය තුළ සිටි විවිධ ක්‍රියාධරයින්ගේ කාර්යභාර, සාමය ගොඩනැගීම සහ ගැටුම් ව්‍යාවර්තනය සඳහා වූ ඕනෑම ප්‍රයත්නයකදී පැහැදිලි දෘෂ්ටියක සහ කැපවීමක අගය පැහැදිලිව පෙන්නුම් කරයි. එක්සත් ජාතීන් (එ.ජා.) සහ අනතුරුව අනෙකුත් බහුපාර්ශවීය රාජ්‍ය ක්‍රියාධරයින් (පථ අංක 1) යුද නායකයින් අතර නොයෙක් සාම ගිවිසුම් සම්බන්ධයෙන් අතරමැදියන් ලෙස කටයුතු කිරීමට අසාර්ථක උත්සාහයන් ගත් අතර, ස්වීඩනයේ දේවස්ථාන සභාව පදනම් කරගත් රාජ්‍ය නොවන සංවිධානයක් වන LPI හි සමාන්තර කටයුතු සෝමාලියාවේ සාමය ගොඩනැංවීමට විශාල බලපෑමක් කළේය. පසුගිය අට වසරක කාලය තුළ ජීවිත සහ සාම ආයතනය (LPI) ආයතනය විවිධ වූ සෝමාලියා සිවිල් සමාජ කණ්ඩායම් සහ පහළම මට්ටමේ ජන කොට්ඨාස ගණනාවක් සාර්ථක ලෙස ශක්තිමත් කොට ඇත (Paffenholz 2001).



සෝමාලියාවේ LPI හි ක්‍රියාකාරීත්වයේ ශක්තිය එය විසින් යොදාගන්නා ලද සියලු උපායයන් පිටුපස වූ ගාමක බලවේගය වන දෘෂ්ටිය තුළින් මතු වූවකි. මුළු LPI කාර්යය මණ්ඩලයේම පැහැදිලිව පෙනෙන කැපවීම සහ පහළ සිට ඉහළට යොමු වූ, ප්‍රජාව පදනම් කරගත් සාමය ගොඩනැගීමේ ප්‍රවේශය කෙරෙහි තබන ලද දෘඩ විශ්වාසය අවසානයේදී ක්‍රියාවලිය තුළ දී මුහුණ දෙන ලද සියලු දුෂ්කරතා ජය ගැනීමට උපකාරී විය. උදාහරණයක් වශයෙන්, දකුණු සෝමාලියාවේ බොහෝ සෙයින් සාර්ථක වූ දිස්ත්‍රික් සභා පිහිටුවීමට LPI ආයතනය මුලදී සහයෝගය දුන්නේය. එහෙත් අයිඩිඩ්ගේ සන්නද්ධ කණ්ඩායම ප්‍රදේශය තුළ හමුදාමය වශයෙන් මැදිහත් වූ සැණින් මේවා බිඳ වැටිණි. එ. ජා. සංවිධානය කලාපයෙන් ඉවත් වූ අතර, LPI ආයතනය සිය උත්සාහය දිගටම කරගෙන ගියේය. LPI වයඹ දිග සෝමාලියාවේ: සෝමාලිලන්තයේ ප්‍රාදේශීය ප්‍රතිසන්ධානය සඳහා තවදුරටත් උපකාර කළේය. 1994 දී යුද්ධය ඇති වූ විට පවා සමගිය අත්කර ගැනීම සඳහා සෝමාලිලන්ත සමාජයේ හැකියාවන් කෙරෙහි LPI දිගටම විශ්වාස තැබූ අතර, සාම ක්‍රියාවලිය ඉදිරියට යන විට අනෙකුත් සියලු බාහිර ක්‍රියාධරයින් ඉවත්ව සිටියදී LPI එම ක්‍රියාවලියට සහාය දුන් මුල් කණ්ඩායම් අතුරින් එකක් විය.

**කොටුව I LPI හි දෘෂ්ටිය**

සාමය ගොඩනැගීම කෙරෙහි වන LPI හි ප්‍රවේශයේ මූලික දර්ශනය පහත සඳහන් ලෙස ගෙන හැර දැක්විය හැකිය.

- කල්පවතින සාමය ගොඩනැගීම දීර්ඝ කාලීන ක්‍රියාවලියක් වන අතර, එය අත්කර ගත හැක්කේ ගැටුම පවතින සමාජය තුළිනි.
- කල්පවතින සාමය ගොඩනැගීම යනු ප්‍රභූ පැලැන්තිය පමණක් නොව සමස්ත සමාජයම සම්බන්ධ වන ක්‍රියාවලියකි.
- කල්පවත්නා සාමය ගොඩනැගීම ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලියක් වෙත මග පෙන්වයි. එනම් ප්‍රචණ්ඩ සංස්කෘතියක් සාම සංස්කෘතියක් බවට ව්‍යාවර්තනය කරයි.
- කල්පවතින සාමය ගොඩනැගීම ප්‍රාදේශීය ප්‍රජාවගේ මට්ටමෙන් ආරම්භ කළ යුතුය.

කල්පවත්නා සාමය ගොඩනැගීම සඳහා අර්ථවත් දායකත්වයක් සැපයීම පිණිස LPI ආයතනය "පතුලේ සිට ඉහළට සාමය ගොඩනැගීම" හෙවත් "ප්‍රජාව පදනම් කරගත් සාමය ගොඩනැගීම" යනුවෙන් නම් කොට ද්විත්ව-ප්‍රවේශන ක්‍රමයක් සකස් කොට ඇත. මෙම ප්‍රවේශන ක්‍රමය තුළ LPI සිය කාර්යභාරය ද බාහිර පහසුකම් සලසන්නකුගේ කාර්යභාරය ලෙසම නිර්වචනය කරයි. එහි අරමුණු වන්නේ,

- සිවිල් සමාජ ක්‍රියාධරයින්ට සිය කලාපයේ සාමය ගොඩනැගීම සඳහා අර්ථවත් දායකත්වයක් සැපයීමට හැකිවන ආකාරයට සාම ක්‍රියාවලින්හිදී ඔවුන්ගේ කාර්යභාරය ශක්තිමත් කිරීම;
- සමාජයේ සෑම මට්ටමක් තුළටම ජනතාව පදනම් කරගත් කල්පවත්නා සාමය ගොඩනැගීම පිළිබඳ දර්ශනය කා වැද්දීම.

## 2.2. ගැටුම් සහ ක්‍රියාධරයින් විශ්ලේෂණය කිරීම

සෑම සමාජමය ප්‍රපංචයක් මෙන් ම, ගැටුම් ද අතිශයින්ම සංකීර්ණ නැඹුරුවකින් යුත් වෙයි. ඕනෑම අන්තර් පුද්ගල ගැටුමකට ආවේණික සංකීර්ණ පරාමිතීන්ට අමතරව, සන්නද්ධ ගැටුම් නිරූපණය කරන ක්‍රියාධරයින් සහ ගැටලු අවබෝධ කර ගැනීම වඩාත් දුෂ්කරය (Wehr 1979). එහෙයින් මැදිහත්වන ක්‍රියාධරයින් නිශ්චිත ගැටුමේ පසුතලය අවබෝධ කර ගැනීමට කටයුතු කිරීම අත්‍යවශ්‍යය.

ගැටුම් විශ්ලේෂණය සඳහා විවිධ වූ ප්‍රවේශ ක්‍රම ඇත. විශ්ලේෂණයේ මට්ටම් තුනෙන් (උපරිම, මධ්‍යම, සහ අවම) පෙන්නුම් කෙරෙන අයුරින් මෙම උපායයන් සහ මෙවලම් විද්වත් සහ ප්‍රායෝගික, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක, සහභාගීත්ව සහ සහභාගීත්ව නොවන ක්‍රමවේද ලෙස වෙන්කොට දැක්විය හැකිය.

**(i)** සාර්ව (උපරිම) මට්ටම:

මෙම මට්ටම ගැටුම් සහ ක්‍රියාධරයින් පිළිබඳ විශ්ලේෂණය සම්බන්ධයෙන් වූ වඩා විද්වත් ප්‍රවේශයන්ගෙන් පිරුණකි. මෙහිදී පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති තුළ වර්ධනය වී, අනතුරුව ආධාර දෙන ප්‍රජාව විසින් භාවිත කෙරෙන අර්බුද දර්ශකයන් පිළිබඳ නිර්වචනය කෙරෙහි වඩා පොදු ප්‍රවේශයක් ඇති කරනු ලැබේ. ආධාර දෙන ආයතනවලට සිය මෙවලම් සහ තොරතුරු අවශ්‍යතා නිශ්චිත ගැටුම් තත්ත්වයකට ගළපා ගත හැකිවන අයුරින් මෙම අර්බුද දර්ශක 'ඉහළ', 'පහළ' සහ 'අවදානමක් නැති' යනුවෙන් ප්‍රභේද තුනකට රටවල් බෙදයි (Spelton 1999 බලන්න).

ආධාර දෙන ප්‍රජාව තුළ මෑතකදී වැඩි දියුණු කෙරුණු අනෙක් පොදු විශ්ලේෂණාත්මක ප්‍රවේශයන්, සහභාගීත්ව වේග ඇගැයීම් වැනි සංවර්ධන සහයෝගීතාව පිළිබඳ ස්ථාපිත මෙවලම්, සම්භාව්‍ය ගැටුම් විශ්ලේෂණය සමග ඒකාබද්ධ කොට ඇත (Mehler and Ribeaux 1999). ගැටුම්වල පොදු හේතු මැදිහත්වීමේ ක්‍රියාවන් සමග සම්බන්ධ කරන ප්‍රවේශනයක් පිළිබඳ හොඳ උදාහරණයක් නම් යුරෝපා සංගමයේ මාර්ගෝපදේශනය වන *Peace Building and Conflict Prevention : A Practical Guide* (Lund & Mehler 1999) ය.

ගැටුම් විශ්ලේෂණය කෙරෙහි වූ වඩාත් ශාස්ත්‍රීය ප්‍රවේශනයක් නම් පෝල් වෙහ්ර් විසින් මුලින්ම සම්පාදනය කරන ලද (1979) ගැටුම් සිතියම්ගත කිරීමේ මාර්ගෝපදේශයයි. මෙම මාර්ගෝපදේශය ඕනෑම ගැටුම් විශ්ලේෂණයකදී නිසි ලෙස සලකා බැලිය යුතු කාරණා පහක් අවධාරණය කරයි: ගැටුම් ඉතිහාසය, ගැටුම් සන්දර්භය, ගැටුමේ පාර්ශව, ගැටුමට අදාළ ගැටලු, ගැටුමේ ගතිකතා යනු ඒ කාරණා පහයි. ගැටුම් සිතියම්ගත කිරීම පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් ක්‍රියාධරයින් පිළිබඳව රූපගත කරන ලද ගුණාත්මක විශ්ලේෂණයක් සහ ඔවුන් එකිනෙකා අතර සම්බන්ධතාව ගෙනහැරපායි.



එවැනි රූපගත කරන ලද ගුණාත්මක විශ්ලේෂණයක් සඳහා සිතියම් ගත කරන්නෝ ගැටුම් සන්දර්භය, පාර්ශවයන් සහ හේතු පිළිබඳව තොරතුරු රැස්කරති. එවැනි සිතියම්ගත කිරීමේ කටයුත්තක් සමස්ත තත්ත්වයේ පොදු සමාලෝචනයක සිට ගැටුමේ නිරත පාර්ශවකරුවන්ගේ වටිනාකම්, ඵල ප්‍රයෝජන සහ අවශ්‍යතා පිළිබඳ ගැඹුරු විග්‍රහයක් දක්වා ගැටුමේ විවිධ මට්ටම් සියල්ල පිළිබඳ විද්වත් සහ සහභාගීත්ව යන දෘෂ්ටීන් දෙකෙන්ම කළ හැකිය (වෙහ්ර් 1978 බලන්න). වෘත්තිකයින් කණ්ඩායම් ගැටුම්වල සංකීර්ණ ස්වභාවය සරල කොටගෙන අවබෝධ කරගැනීමට උත්සාහ කරන නිසා මෙම තාක්ෂණික ක්‍රමය විශේෂයෙන්ම ප්‍රයෝජනවත්ය.

සන්නද්ධ ගැටුමේ නිරත ක්‍රියාධරයින් අවබෝධ කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, ජෝන් පෝල් ලිඩරාක් ද මේ හා සමාන ප්‍රවේශ ක්‍රමයක් සකස් කොට ඇත. ඔහු ගැටුම් ප්‍රදේශවල නායකත්ව මට්ටම් අතර වෙනස්කම්, ඉහළ මට්ටම මධ්‍යම මට්ටමෙන්ද, මධ්‍යම මට්ටම පහළම මට්ටමෙන්ද වශයෙන් වෙන් කෙරෙන පරිදි ක්‍රියාධරයින් පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. එකම අච්චුව තුළ සිටිය හැකි හා සිටින සාම ක්‍රියාධරයින් විග්‍රහ කරමින් ඔහු අදාළ මැදිහත්වීම් උපායයන් ඉදිරිපත් කරයි (ලිඩරාක් 1997). මේ වර්ගයේ සිතියම්ගත කිරීම් බාහිර මැදිහත්වීමේ ක්‍රියාධරයින්ගේ අදහස් අභ්‍යන්තර සාම ක්‍රියාධරයින් වෙතට විවෘත කර දක්වන නිසා ඒවා බාහිර මැදිහත්වීමේ ක්‍රියාධරයින් හට විශේෂයෙන්ම ප්‍රයෝජනවත්ය.

ගැටුම් විශ්ලේෂණය කෙරෙහි වූ වඩාත් විස්තරාත්මක ප්‍රවේශ දකින්නට ලැබෙන්නේ පූර්ව අනතුරු ඇඟවීමේ ක්ෂේත්‍රයෙහි ය. විද්වත්හු ගැටුම් විශ්ලේෂණ ප්‍රවේශ කෙරෙහි වූ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් වෙන් කොට දකිති. ධනාත්මක හා ඍණාත්මක මැදිහත්වීම් සාධක ද විශ්ලේෂණය කරමින්, ගුණාත්මක විශ්ලේෂණය පුරුදු පරිදි වශයෙන් නිශ්චිත ගැටුමක මූල සහ ආසන්න හේතු විමසා බලයි. මේ ආකාරයේ විශ්ලේෂණයක වැදගත්ම කාරණය වන්නේ තොරතුරු රැස් කිරීමයි. ජාත්‍යන්තර සහ දේශීය විශේෂඥයින්, ජනමාධ්‍ය සහ අන්තර්ජාලය, ප්‍රවෘත්ති ඒජන්සි ආයතන හෝ ගුණාත්මක විශ්ලේෂණය සඳහා පදනම සපයන විද්‍යාත්මක ප්‍රකාශන වෙතින් තොරතුරු ලබාගත හැකි වේ. සහභාගීත්ව විශ්ලේෂණය ද යොදාගත හැකිය: එක්කෝ පර්යේෂකයෝ තම විශ්ලේෂණය ගැටුම් ප්‍රදේශයෙන් පිටත මෙන්ම ඇතුළත විශේෂඥ ප්‍රෙක්ෂක පිරිසකට ඉදිරිපත් කරති. නැතිනම්, විශ්ලේෂණය ආරම්භයක් වශයෙන් ගැටුම් හේතු ඒකාබද්ධ කොට ගනිති. සහභාගිත්ව විශ්ලේෂණය සඳහා සහභාගිවන්නන් තෝරාගැනීම අනිවාර්ය වෙයි. මෙම ක්‍රමවේදය විශ්ලේෂණයේ සෑම මට්ටමකදීම භාවිත කළ හැකිය.

අනෙක් අතට, 'සිද්ධි-දත්ත විශ්ලේෂණය' වැනි ගැටුම් විශ්ලේෂණය කෙරෙහි වූ ප්‍රමාණාත්මක ප්‍රවේශ, ප්‍රචණ්ඩ හා ප්‍රචණ්ඩ නොවන අරගලවලට සහ පූර්ව අනතුරු ඇඟවීමේ දී භාවිත කළ හැකි පොදු තොරතුරුවලට සංවේදී දත්ත කාවයක් යොදාගනිමින්, ලෝක ව්‍යාප්ත ප්‍රවෘත්ති ආයතන වාර්තා සංග්‍රහගත කිරීමෙහි යෙදී සිටියි. මෙම සංග්‍රහගත කිරීම විශේෂයෙන් සකස් කරන ලද මෘදුකාංග මගින් ස්වයංක්‍රීයව හෝ අතින් හෝ කළ හැකිය. විවිධ පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයන්හි භාවිත කෙරෙන 'ස්වයංක්‍රීය සිද්ධි-දත්ත සංවර්ධන මෙවලම්' සකස් කළ වර්චුවල් රිසර්ච් ඇසෝසියේට් (Virtual Research Associate-VRA) නම් ඇමෙරිකානු ආයතනයේ කටයුතු මගින් මීට උදාහරණ ලබාගත හැකිය. 

උදාහරණයක් වශයෙන්, ස්විස් සාම පදනමේ (*Frihanalyse von Spannungen and Tatschenermittung*; (FAST) පූර්ව අනතුරු ඇඟවීමේ ව්‍යාපෘතිය ගැටුම් විශ්ලේෂණය සඳහා වූ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ප්‍රවේශ දෙක මෙන් ම සහභාගිත්ව ප්‍රවේශයන් ද ඒකාබද්ධ කරයි (Krummenacher and Schmeidl, 1999). FAST සාම්ප්‍රදායික ගුණාත්මක විශ්ලේෂණයන් අනුගමනය කරන නමුත් ඒ ඒ රටවල් නිරීක්ෂණය කිරීම සඳහා විශේෂයෙන්ම සකස් කරනු ලැබ ඇති විශ්ලේෂණාත්මක රාමුවක් භාවිත කරමින් පූර්ව ක්‍රියාකාරකම් මැදිහත්වීමේ සාධක තවදුරටත් නිරීක්ෂණය කොට විශ්ලේෂණය කරයි. අනතුරුව, සිද්ධි-දත්ත විශ්ලේෂණ සඳහා වූ ස්වයංක්‍රීය හා අතින් ක්‍රියාත්මක සංග්‍රහ ගත කිරීමක් මගින් මෙන්ම ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණයන් දෙකේම ප්‍රතිඵලවල නිරවද්‍යතාව සොයා බැලීම සඳහා උපදේශන ලබාගන්නා ලද දේශීය සහ ජාත්‍යන්තර විශේෂඥ ජාලයන්හි මතවාද මගින් මෙම සමස්ත පද්ධතිය තවදුරටත් පෝෂණය කෙරේ.

### (ii) මධ්‍යම මට්ටම

ඉහතින් විස්තර කරන ලද බොහෝ ප්‍රවේශ මධ්‍ය මට්ටමේදී ද යොදා ගත හැකිය. විශේෂයෙන්ම VRA භාවිත කරන ඒවා වැනි ගුණාත්මක සහ/හෝ සහභාගීත්ව ගැටුම් සිතියම්ගත කිරීම් සහ ප්‍රමාණාත්මක ක්‍රම මේ සඳහා සුදුසු වේ. එහෙත් අද දක්වාත් VRA තාක්ෂණ කලාපීය සහ දේශීය

මට්ටමේදී භාවිත කෙරී නැත. මීට ප්‍රතිචාර වශයෙන් විශේෂිත රටවල් සඳහා මෙම මට්ටම් දෙකේදීම මෙම ක්‍රම භාවිත කරන ලෙස FAST ව්‍යාපෘතිය තුළ නිර්දේශ කෙරේ.

මෙම මට්ටමේ මැදිහත්වීමේ දී ගැටුම් විශ්ලේෂණය සඳහා නිශ්චිත ප්‍රවේශ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒවායින් වඩාත් කැපී පෙනෙන ප්‍රවේශ දෙකක් වන්නේ *යුද වැදුණු සමාජ පිළිබඳ ව්‍යාපෘතියේ* (WSP) ක්‍රියාකාරීත්වය මුල්කොටගත් පර්යේෂණ ක්‍රමවේදය සහ *Aktion Afrika Hilfe* e.V. (AAH) නම් රාජ්‍ය නොවන සංවිධානය විසින් පුළුල් කරන ලද ප්‍රජා සංවර්ධන ප්‍රවේශයයි (Erasmus 2000 බලන්න). WSP ප්‍රවේශය යටතේ විද්වත් සහ ප්‍රායෝගික ක්‍රමවේද ඒකාබද්ධ කරමින් පර්යේෂණ සහ සහභාගීත්ව වැඩමුළු මාර්ගයෙන් අදාළ තොරතුරු එක්රැස් කෙරේ. ගැටුම් පිළිබඳ ඒකාබද්ධ (බාහිර ක්‍රියාධරයින් සහ දේශීය හවුල්කරුවන්) සහභාගිත්ව විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම සඳහා AAH වඩාත් ප්‍රායෝගික ප්‍රවේශය අනුගමනය කරන අතර, සංවර්ධන සහයෝගීතාව මගින් සැකසෙන සහභාගිත්ව ප්‍රවේශය සමග සමාජීය විද්‍යාඥයින් විසින් සකස් කරන ලද ක්‍රියාවලි සඳහා වූ ක්‍රමවේද ඒකාබද්ධ කරයි.

### (iii) සූක්ෂම (අවම) මට්ටම

ගැටුම් සහ ක්‍රියාධරයින් සිතියම්ගත කිරීම දේශීය/ ව්‍යාපෘති මට්ටමේ මැදිහත්වීමේදීද අතිශයින්ම ප්‍රයෝජනවත්ය, විශේෂයෙන්ම සහභාගිත්ව ආකාරයෙන් ක්‍රියාත්මක කළ විට එය එසේ වන්නේය. AAH ප්‍රවේශය තුළ වර්ධනය කරන ලද බොහෝ විශ්ලේෂණාත්මක මෙවලම්, ව්‍යාපෘති මැදිහත්වීම පිළිබඳ මෙම ප්‍රාදේශීය මට්ටමේදී ඵලදායී උපයෝගීතාවක් අත් කර ගනී. තවද, ප්‍රවේශ සහ ක්‍රමවේද යනු ක්‍රියාවලි අරමුණු කරගත් සහ සහභාගික ඒවා වන තාක්, කුමන නිශ්චිත ප්‍රවේශ සහ ක්‍රමවේද භාවිත කෙරෙන්නේද යන්න දැන ගැනීමෙහි එතරම් පලක් නැත. සමහරවිට විවිධ ක්ෂේත්‍රවලදී සකස් කරන ලද ක්‍රමවේදයන්ගේ සංයෝගයක් වුවද ගැටුම් සහ ක්‍රියාධරයින් විශ්ලේෂණය කිරීම සඳහා ඵලදායී මෙවලමක් වශයෙන් ක්‍රියා කළ හැකිය.



මේ සම්බන්ධයෙන් හොඳ උදාහරණයක් වන්නේ විවිධ වූ ක්‍රියාවලි අරමුණු කරගත් සහ සහභාගිත්ව ප්‍රවේශ ගණනාවක් ඒකාබද්ධ කරන ව්‍යාපෘති චක්‍ර කළමනාකරණයයි (Project Cycle Management - PCM). PCM යනු වැඩසටහන් හා ව්‍යාපෘති යන මට්ටම් දෙකෙන් ම ආධාර-මැදිහත්වීම සැලසුම් කිරීම සඳහා වූ තොරතුරු එක්රැස් කිරීමේ මාර්ගෝපදේශයක් වශයෙන් ආරම්භයේදී සකස් කරන ලද ජර්මානු *Zielgruppen - Orentierte Projekt Planung (ZOPP)* පදනම් කරගත් නවීකරණය කරන ලද සහ පුළුල් කරන ලද තාර්කික රාමුගත ප්‍රවේශයකි (Information Training and Development Ltd, 1999 බලන්න). PCM සහ ZOPP යන දෙකම ප්‍රශ්නයකට කාඩ්පතක් බැගින් කඩදාසි කාඩ්පත් යොදාගනිමින් සහභාගිත්ව ගැටලු විශ්ලේෂණයකින් පටන් ගෙන, අනතුරුව ගැටලු එකට ගොනු කරයි. දෙවැනි පියවරකදී, ව්‍යාපෘති මැදිහත්වීම් උපායන් වර්ධනය කිරීමට පෙර ගැටලු අරමුණු බවට හරවා තවදුරටත් එකට ගොනු කෙරේ. PCM සහ ZOPP හි විස්තරාත්මක මෙවලම් ගැටුම් විශ්ලේෂණය සඳහා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකිය. නිසි ලෙස ක්‍රියාත්මක කරන ලද PCM භාවිතයක කොටසක් වශයෙන් පුළුල් කරන ලද පාර්ශ්වකාර විශ්ලේෂණයක් සමග ක්‍රියාධර විශ්ලේෂණය ඉතා හොඳින් හසුරුවා ගත හැකිය.

ඒකාබද්ධ PCM/ ZOPP ගැටුම් විශ්ලේෂණයේ ප්‍රධාන අඩුපාඩුව නම් ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කළ හැකි දියුණු මෙවලම් හිඟකමයි. එහෙත් මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා ආධාර ආයතන පර්යේෂණ ක්‍රියාවලියක් ආරම්භ කරමින් සිටියි.

## 2.3. උපාය සහ කාර්යභාර

ස්වභාවයෙන්ම දෘෂ්ටිය යනු සාර්ථකත්වය සඳහා සහතිකයක් නොවේ. මැදිහත්කාරී ක්‍රියාධරයින් තම දෘෂ්ටීන් ඵලදායී ක්‍රියාකාරී මැදිහත්වීම් උපායයන් ලෙස පරිවර්තනය කර ගැනීමෙහි ලා සාර්ථක විය යුතුය. ඔවුන්ගේ ඉලක්ක පැහැදිලිව පැවතිය යුතු වන අතර, මෙම ඉලක්ක සපුරා ගැනීමේදී සකස් කෙරෙන උපායයන් වෙනස් විය හැකිවා සේම, ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලියේ දී අනුවර්තනය කර ගැනීමට හෝ නවීකරණය කර ගැනීමට හැකි විය යුතුය.

මැදිහත්වීමක ආරම්භයේ සිටම ක්‍රියාධරයින් ක්‍රියාවලිය තුළ සිය භූමිකාව අවබෝධ කරගත යුතුය. බාහිර ක්‍රියාධරයින් පිටස්තරයින් ලෙස සිය භූමිකාව සීමිත බවත්, අභ්‍යන්තර ක්‍රියාධරයින්ට සහයෝගය දෙන්නට සමත් වන ප්‍රමාණය මත සිය ඵලදායකත්වය රඳා පවතින බවත් පිළිගත යුතුය.

අභ්‍යන්තර ක්‍රියාධරයින් ශක්තිමත් කිරීමේ උපායයන් සකස් කර ගැනීම අවශ්‍ය වේ. පවතින තත්ත්වයට නම්‍යශීලී ලෙස ගැළපීමක් සහිත උපාය මාලා එකතුවක අවශ්‍යතාව අත්දැකීම විසින් පෙන්වා දෙනු ලබයි. වෘත්තිකයින් කළ යුතු හොඳම දේ පහසුකම් සැලසීම හෝ, මැදිහත්වීම ද නැත්නම් පුහුණුව දීම හෝ හැකියා වර්ධනය ද එසේත් නැතිනම් ප්‍රශ්න විසඳීමේ වැඩමුළු සංවිධානය කිරීම හෝ, දේශීය සාම වැයම්වලට හුදෙක් මුදල් සැපයීම දැයි තීරණය කරගත යුතුය. මෙය සංවිධානයක හැකියාව මත පමණක් නොව, නිශ්චිත සාම ක්‍රියාවලියක අවශ්‍යතා මත සහ සම්බන්ධිත වී සිටින දේශීය ක්‍රියාධරයින් මත ද තීරණය කෙරෙන්නෙකි. උදාහරණයක් වශයෙන් LPI බිම් මට්ටමේ පුහුණුවීම් මඟින් ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහයන් සඳහා හැකියාවන් ගොඩනැගීම මෙන්ම ප්‍රාදේශීය සමගි සමුළු ප්‍රවර්ධනය සහ ඒවාට සහාය දීම වැනි උපාය මාලාවක් සෝමාලියාවේ ක්‍රියාත්මක ලද අතර, අනෙක් අතට මොසැම්බික්හි සාම ක්‍රියාවලියෙහි ඉතාලි රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජාව වන සැන් එජිඩියෝහි ක්‍රියාකාරීත්වය, මැදිහත්වීම සහ ප්‍රධාන ගැටුම් පාර්ශවයන්ට පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කළේය (පැෆන්හෝල්ස් 2000 බලන්න).

එසේම බාහිර සංවිධාන පරස්පර විරෝධී උපායයන් ඉදිරිපත් කිරීමෙන් වැළකීම අත්‍යවශ්‍යය. උදාහරණයක් වශයෙන්, දීර්ඝ කාලීන ප්‍රජාතාන්ත්‍රිකරණ ව්‍යාපෘතීන් නිතරම කෙටි කාලීන අර්බුද නිවාරණ පියවර සමග නොගැළපිය හැකිවන අතර, සාම ගුවන් විදුලිය වැනි ඍජු සාම ව්‍යාපෘතියකට දෙන සහයෝගය ප්‍රාදේශීය මානව හිමිකම් කේන්ද්‍රයකට දෙන සහයෝගය සමග ඉතා හොඳින් ගැළපිය හැකිය.

නව උපායයන්හි නිරත වන්නට පෙරාතුව වෘත්තිකයින් තම සංවිධානයේ සීමාවන් ද පැහැදිලි කළ යුතුය. සෝමාලියාවේ LPI යොදාගත් උපායන් පිළිබඳ විචාරවත් විශ්ලේෂණයක් මගින් හෙළිවනුයේ LPI තමන්ගේම හැකියාවන්ගේ ප්‍රමාණවත් ප්‍රත්‍යවේක්ෂණ අනුව මගපෙන්වනු ලබනු වෙනුවට සමහරවිට

බාහිර වර්ධන මගින් බොහෝ දුරට මෙහෙයවනු දැකගත හැකිය. LPI අවස්ථාවන් හිදී අනෙකුත් වැදගත් කාර්යයන් නොතකා හරිමින් පුහුණුව වැනි නිශ්චිත උපායන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි පමණ ඉක්මවා අවධානය යොමු කළේය. එහෙයින්, වඩාත් ගැළපෙන ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම පිණිස සංවිධානයකට අවශ්‍ය වන්නා වූ ද, ඊට ඔරොත්තු දෙන්නා වූද සමස්ත උපාය මාලාව පිළිබඳ ව දැනුවත් ව සිටීම වැදගත්ය.

අත්‍යවශ්‍ය මූලික කාරණා ගණනාවක් තිබේ: පැහැදිලි දෘෂ්ටිය, සුදුසු උපායයන් සකස් කිරීම සහ ක්‍රියාවලිය තුළ සංවිධානයක භූමිකාව පිළිබඳ විනිවිද පෙනෙනසුලු සංයුක්ත නිර්වචනය ඒ කාරණාය. කෙසේ වුවද මෙය කුමන අවස්ථාවකදීවත් නම්‍යශීලී භාවය සඳහා වූ සමගාමී අවශ්‍යතාවට හිලව් වන්නේ නැත: වෘත්තිකයින් නව වර්ධනයට මුහුණදීම සඳහා නිරතුරුව උපායයන් සහ භූමිකා සකස් කරගත යුතුය. අභියෝගය නම් පැහැදිලි උපායයන් සහ මෙවලම්වල උපරිම සංයෝගය සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහාත් ක්‍රියාවලියට අනුවර්තනය කර ගනු සඳහාත් නම්‍යශීලී ක්‍රමයක් සොයා ගැනීමයි.

## 2.4. නිසි හවුල්කරුවන් සහ ප්‍රවේශ ස්ථාන සොයාගැනීම

නිසි හවුල්කරුවන් සහ ප්‍රවේශ ස්ථාන සොයාගැනීම යනු සමීප ලෙස එකිනෙක වෙළුණු කාරණා දෙකකි. නිතරම පාහේ ප්‍රවේශ ස්ථාන සහ උපායයන් පවා තීරණය වනුයේ හවුල් කරුවන් අනුවය. සමහර හවුල්කරුවෝ 'නිසග' හවුල් කරුවෝය; සමහරු තෝරාගනු ලබන්නෝය; ඒ අතර, සමහරු මේ දෙකේම සංකලනයක් වෙති. රාජ්‍ය පථ II ක්‍රියාධරයින් සහ විශාල ආධාරකරුවන් සාමාන්‍යයෙන් ගැටුම් කරළියේ පුළුල් පරාසයක ක්‍රියාධරයින්ට සමීප වීමේ පහසු මාර්ග දිනාගන්නා නමුත්, රජයේ නොවන පථ II ක්‍රියාධරයන්ට බොහෝ විට තමන්ගේ නිශ්චිත ජන කොට්ඨාසය වෙතට හෝ තමන්ට ආරාධනා කළ සංග්‍රහකයා වෙතට පමණක් සමීප විය හැකිය (පැඟන්හෝල්ස් 2000a). පැහැදිලිව පෙනෙන පරිදි සාර්ව (උපරිම) මට්ටමේ කටයුතු කරන තුන්වැනි පාර්ශවයන් ගැටුමේ ප්‍රධාන පාර්ශවයන්ගේ නියෝජිතයින් සමග ඍජුව කටයුතු කළ යුතු වන අතර, මධ්‍යම මට්ටමේ සහ සූක්ෂම (අවම) මට්ටමේ කටයුතු කරන ක්‍රියාධරයින්ට තෝරා ගැනීම සඳහා වඩා පුළුල් පරාසයක් ලැබේ. පහත සඳහන් කරුණු දෙක ප්‍රධාන වශයෙන් ම දෙවනුව සඳහන් කරන ලද මෙම ක්‍රියාධර කණ්ඩායමට ගැළපේ.

පළමුව, පාර්ශවකරුවන් විය හැකි සියලු දෙනාගේ ම ශක්තීන් සහ දුර්වලතා විග්‍රහ කළ යුතු වේ. සමහර පාර්ශවකරුවන් වෙත සම්පත් සුළු ප්‍රමාණයක් තිබෙන අතර, අනෙක් අය හැකියා හෝ උපායික විකල්ප හිඟකමෙන් පෙළිය හැකිය. අනෙක් අය ගැටුම් පාර්ශ්වයන්ගේ ඇසින් ප්‍රත්‍යක්ෂ සුජාතභාවය අනුව වෙනස් වෙති. හවුල්කාරීත්වය සහ හවුල්කාර අපේක්ෂකයින් පිළිබඳව තක්සේරු කොට තීරණ ගන්නා විට මෙම වත්කම් හා වගකීම් පරිස්සමින් සැලකිල්ලට ගත යුතුය (CIAA 2000).

දෙවනුව, ඕනෑම මැදිහත්වීමක සාර්ථකත්වය සඳහා බාහිර සහ අභ්‍යන්තර හවුල්කරුවන් අතර මනා සබඳතාවක් අනිවාර්යයෙන්ම අත්‍යවශ්‍යය. දේශීය හවුල්කරුවන්ට හුදෙක් සම්පත් අවශ්‍ය වන නිසා ඔවුහු සාමාන්‍යයෙන් බාහිර හවුල්කරුවන්ගේ මැදිහත්වීම් උපාය පිළිගනිති. සෑම ප්‍රත්‍යෙකයකදීම දෙපාර්ශවය තම තමන්ගේ වුවමනාවන් සහ හරයන් පිළිබඳව පැහැදිලි තැනක සිටිය යුතුය (Motte Foundation, 1999).

(i) ආධාරකරුවෝ :

බොහෝ විට ආධාරකරුවෝ දේශීය සාම ක්‍රියාධරයින්ට ඍජුව සහාය නොදෙන නමුත්, එ. ජා. ආයතනය වැනි ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, දේවස්ථාන සහා පදනම් කරගත් හෝ ක්‍රියාකාරීත්වයට නැඹුරු පර්යේෂණ සංවිධාන හරහා ආධාර සපයති. මෙම එ. ජා. ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියා කරන්නේ බාහිර ආධාරකරුවන් සහ අභ්‍යන්තර ක්‍රියාධරයින් අතර දොරටුපාලයන් ලෙස හෝ පහසුකම් සලසන්නන් ලෙසය. බොහෝ විට අභ්‍යන්තර ක්‍රියාධරයින්ට පෞද්ගලිකව පෙනෙන්නට සිටින එකම පාර්ශවය බාහිර රාජ්‍ය නොවන සංවිධානයයි. ඇත්ත වශයෙන්ම, අභ්‍යන්තර ක්‍රියාධරයින්ට ඍජුව ආධාර කිරීමට ද බාහිර ආධාරකරුවන්ට පුළුවන; උදාහරණයක් වශයෙන් බොහෝ බටහිර තානාපති කාර්යාල ගැටුම් ප්‍රදේශවල කුඩා ප්‍රාදේශීය ව්‍යාපෘතිවලට මුදල් දෙයි. එහෙත් සාමාන්‍යයෙන් වන්නේ වඩා විශාල ව්‍යාපෘතීන් සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මගින් හෝ එ.ජා. ආයතන මගින් හෝ ආධාර කිරීමයි.

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන නිසි ආධාරකරු සමග කටයුතු කිරීම අතිශයින් ම වැදගත්ය. රාජ්‍ය නොවන සංවිධානයේ මුලස්ථානයට සහ ප්‍රධාන කටයුතුවලට අවශ්‍ය කරන මූලික මුදල් ආධාර ද ලැබෙන අතර, ඊට අමතරව ගැටුම් ව්‍යාවර්තනයට සහ සාමය ගොඩනැගීමේ ව්‍යාපෘතීන්ට සම්බන්ධ නොවන නම්‍යශීලී මුදල් ආධාර ද ලැබෙන විට මෙම සංවිධාන හෝ පර්යේෂණ ආයතන සාමාන්‍යයෙන් වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වේ.

උදාහරණයක් වශයෙන් ආධාරකරුවෙකු වශයෙන් යුරෝපා සංගමය අර්බුද ප්‍රදේශවල කටයුතු කරන යුරෝපීය රාජ්‍ය නොවන සංවිධානවලට මුදල් ආධාර දෙයි. යුරෝපා සංගමයේ අශෝභන නිලධාරී තන්ත්‍රයට ආවේණික ව්‍යාකූල මුදල් පටිපාටි සහ ගෙවීම් ප්‍රමාදයන්, යුරෝපා සංගමයෙන් මුදල් ලබන රාජ්‍ය නොවන සාම සංවිධානවලට දේශීය සාම ජන කොට්ඨාසවල අවශ්‍යතා නම්‍යශීලී ලෙස හා නිසි වේලාවට සපුරාලීම අතිශයින්ම දුෂ්කර කරවයි. බොහෝ විට, තනි තනි රාජ්‍ය ආධාරකරුවන්ට පවතින තත්ත්වයේ අවශ්‍යතා අනුව අරමුදල් සපයා ගැනීම වඩාත් හොඳින් කළ හැකි වේ. ආධාරකරු සහ රාජ්‍ය නොවන සංවිධාන අතර ප්‍රමාණවත් විශ්වාසයක් පවතින විට සහ දෙපාර්ශවයට පොදු දෘෂ්ටියක් ඇතිවිට මෙය වඩාත් කාර්යක්ෂම වෙයි.



(ii) බාහිර ක්‍රියාධරයෝ :

සාමාන්‍යයෙන් බාහිර පථ I ක්‍රියාධරයින් වන්නේ එ.ජා. ආයතනය, එ.ජා. දූත මණ්ඩල, යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගීතාව සඳහා වූ සංවිධානය (OSCE) වැනි කලාපීය සංවිධාන හෝ කේවල රාජ්‍යයන්ය. බාහිර පථ II හි හෝ III හි ක්‍රියාධරයින් වන්නේ සාමාන්‍යයෙන් ජාත්‍යන්තර සාම සංවිධාන මෙන්ම සංවර්ධන රාජ්‍ය නොවන සංවිධාන, ක්‍රියාකාරීත්වයට නැඹුරු පර්යේෂණ ආයතන හෝ දේවස්ථාන සහා පදනම් කරගත් සංවිධානයි. සාමාන්‍යයෙන් මේ ක්‍රියාධරයෝ බාහිර ආධාරකරුවන් සහ දේශීය සාම ක්‍රියාධරයින් අතර සන්නිවේදනයට පහසුකම් සලස්වමින් දොරටු පාලයින් ලෙස කටයුතු කරති. ඔවුන් දේශීය හවුල්කරුවා තෝරාගැනීමට සහ ඔහුට ආධාර කිරීමට උපකාරී වන අතරම, ආධාරකරුවා සමග දේශීය හවුල්කරුවා ඍජුව සම්බන්ධතා පැවැත්වීම සාර්ථක ලෙස වළකමින්

ඔවුනට මාර්ගය අවහිර කිරීමට ද පුළුවන. එහෙත්, සංකීර්ණ ක්‍රියා පිළිවෙත් සහ වෙනස් ස්වරූප ගත් ව්‍යාපෘති සංස්කෘතීන් හේතු කොට ගෙන දේශීය හවුල්කරුවන් විදේශීය ආධාර කරුවා සමග ඍජුවම සන්නිවේදන සබඳතා ඇති කර ගැනීම විටෙක ගැටලු සහගත වන හෙයින්, රාජ්‍ය නොවන සංවිධානවලට පහසුකම් සැලසීමේ කාර්යභාරය බෝහෝවිට අත්‍යවශ්‍යය.

එසේම, ක්‍රියාවලි බද්ධ ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශයක් සහිතව ක්‍රියා කරන බාහිර මැදිහත්වීම් ක්‍රියාධරයින් තමන් දේශනා කරන දේ අනුගමනය කරන්නේ නම් පමණක් ඔවුනට අභ්‍යන්තර ක්‍රියාධරයින්ගේ විශ්වාසවන්ත හවුල්කරුවන් විය හැකිය. ඒ අනුව, ඔවුන් සිය සංවිධානය තුළ ඇති සාමය ගොඩනැගීමේ ප්‍රවේශය පිළිබඳ දර්ශනය විදහා දැක්විය යුතුය. ඒ එසේ නොවේ නම්, ඔවුන් සමග කටයුතු කරන සිවිල් සමාජ නියෝජිතයින් මෙය ඉක්මනින්ම තේරුම් ගෙන ඒවා බැරෑරුම් ලෙස භාරගැනීම නවතා දමනු ඇත.

### (iii) දේශීය හවුල්කරුවෝ

අභ්‍යන්තර සාම ක්‍රියාධරයින්ට ආධාර කිරීමට උත්සාහ කරන බොහෝ බාහිර මැදිහත්කරුවන් මුහුණ දෙන දුෂ්කර ප්‍රශ්නය වන්නේ ආධාර කළ යුතු සුදුසුම අය කවුරුන්ද යන්නයි. බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හෝ පර්යේෂණ ආයතන ගැටුම් කලාපය තුළ සිටින තමන්ට සමාන පිරිසක් සමග සම්බන්ධ වන්නට පෙළඹෙති. ඒ අනුව, දේවස්ථාන සභා පදනම් කරගත් සංවිධාන දේශීය දේවස්ථාන සභාවලට ආධාර කරන අතර, පර්යේෂණ ආයතන විද්වත් ප්‍රභූන් සමග කටයුතු කිරීමට පෙළඹෙති.



අනෙකුත් නිර්ණායක ද යම් කාර්යභාරයක් ඉටු කරයි. උදාහරණයක් වශයෙන්, හුදෙක් මැදිහත්කරුවාගේ භාෂාවෙන් අදහස් හුවමාරු කර ගැනීමට හැකියාව තිබෙන නිසා සහ බටහිර චින්තන ක්‍රමයට ගැළපෙන්නට හැකියාව තිබෙන නිසා දේශීය පුද්ගලයෝ තෝරා ගැනෙති. මැදිහත්කරුවන් බොහෝ වැදගත් දේශීය කොට්ඨාස වෙතට සමීප වීම නිතර වළක්වාලන්නේ හරියටම මෙම මිනිසුන් නිසා මෙය නියත වශයෙන්ම භයානකය. කවුරුන් කාට කතා කරන්නේ ද යන්න තීරණය කරමින් උගත්, ජේත්තුකාර නාගරික ප්‍රභූහු නිතරම දොරටු පාලයන් ලෙස කටයුතු කරති. එහෙයින් මෙම දේශීය දොරටු පාලයන්ගේ බලපෑම අඩු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

එසේ නම්, දේශීය හවුල්කරුවන් තෝරාගන්නේ කෙසේද? ගැටුම් ව්‍යාවර්තනය සහ සාමය ගොඩනැගීමේ අභියෝග පිළිබඳව ඵලදායක ලෙස සාකච්ඡා කිරීමට සමහර කණ්ඩායම් විශේෂයෙන්ම හොඳින් සුදුසුවන බව පසුගිය වසරවල අත්දැකීම් පෙන්වා දී ඇත. පථ I මට්ටමේ දී ගැටුම් පාර්ශවයන් සමග සමීප සබඳතා පවත්වාගෙන යන්නා වූ ක්‍රියාධරයින් හෝ ගැටුම් පාර්ශ්වයන් තුළම සිටින ක්‍රියාධරයින් හෝ පහසුකම් සැලසීමේ වැයම්වල, සංවාද ව්‍යාපෘතිවල හෝ ගැටුම් විසඳීමේ වැඩමුළුවල නිරත කරවමින් කෙනෙකුට ඔවුන් සමග කටයුතු කළ හැකිය. පථ II සහ III යන මට්ටම්වල දී වඩාත් වැදගත් ක්‍රියාධරයින් වන්නේ දේශීය සාම සහ මානව හිමිකම් කණ්ඩායම්, කාන්තා සාම සහ පක්ෂපාතී කණ්ඩායම්, සාම්ප්‍රදායික අධිකාරීන්, දේවස්ථාන සභා, ජනමාධ්‍ය, වෘත්තික සංවිධාන සහ බොහෝ විට දේශීය ව්‍යාපාරික ප්‍රජාව, හෝ විශේෂයෙන්ම ප්‍රකට හෝ ප්‍රබල සම්බන්ධතා ඇති පුද්ගලයින්ය.

එවැනි කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා මැදිහත්කරුවකු දරන උත්සාහයේ දී විවිධ මෙවලම් භාවිත කළ හැකිය. උදාහරණයක් වශයෙන් පවතින හා පැවැතිය හැකි කණ්ඩායම් පිළිබඳ බාහිර විශ්ලේෂණයක් ප්‍රයෝජනවත් තොරතුරු ලබාදිය හැකිය. අනතුරුව එවැනි අධ්‍යයනයක් බිම් මට්ටම තුළ සකස් කරන ලද සහභාගිත්ව සාම ක්‍රියාධරයින්ගේ ලැයිස්තුවක් සමග ඒකාබද්ධ කළ හැකිය.

සාමාන්‍යයෙන් පුද්ගලයින් සහ සංවිධාන තෝරාගැනීමේ හොඳම ක්‍රමය වන්නේ තෝරාගැනීම කරන්නට ඔවුනටම ඉඩ හැරීමයි. තෝරා ගැනීමේ එක් ක්‍රමයක් නම් නිශ්චිත මැදිහත්වීමේ ක්ෂේත්‍රයක කටයුතුවල නිරත වී සිටින්නන් ගැන සාමාන්‍යයෙන් විමසා බලා, අදාළ ක්‍රියාධරයින් කවුරුන්දැයි සහ සැලසුම් කටයුත්තකදී ඔවුන් ආරාධනා කරන්නේ කා හටදැයි ඔවුන්ගෙන් ප්‍රශ්න කොට දැන ගැනීමයි. මෙසේ ප්‍රශ්න කිරීම නිතරම නෛසර්ගික වටිනාකමක් ඇත්තාවූද, අදාළ සියලු දෙනාගේම අයිතිය උපරිම කරන්නා වූද ක්‍රියාවලියක ආරම්භයකි. මැදිහත්වීමේ සූක්ෂම (අවම) මට්ටමේදී එවැනි ක්‍රියාවලි සැලසුම් කිරීමක් සඳහා රොන් ක්රේබිල් ප්‍රයෝජනවත් ප්‍රශ්න සහ ක්‍රමවේද මාලාවක් යෝජනා කොට ඇත (මෙම වෙළුමේ රොන් ක්රේබිල්ගේ දායකත්වය බලන්න).

කණ්ඩායම් හඳුනාගත් වහාම දේශීය කණ්ඩායම්වලට ප්‍රමුඛත්වය දෙමින් පහත සඳහන් නිර්ණායකය උපයෝගී කරගත යුතුය. එම කණ්ඩායම් ඃ

- සාමකාමී ගැටුම් ව්‍යාවර්තනයට සහාය දීම;
- රට තුළ ක්‍රියාත්මක වීම;
- ස්වීය කාර්යාරම්භයක් ප්‍රදර්ශනය කිරීම;
- ව්‍යාපෘති වැඩට ප්‍රමාණවත් දායකත්වයක් සැපයීමට කැමැත්ත ප්‍රකාශ කිරීම;
- සමාජයේ සමස්ත පරාසයම (බහු වාර්ගික සහ ලිංග සමතුලිත) නියෝජනය කිරීම;
- ආණ්ඩුවලින් ස්වාධීනව සිටීම;
- මූලික ප්‍රජාතන්ත්‍රවාදී රීතීන්ට අනුගත වීම, අවශ්‍ය වේ.

දේශීය හවුල්කරුවන් තෝරාගැනීමේ නිර්ණායකය ආයතනයක ප්‍රතිපත්තිවලට ද අනුකූල විය යුතුය. සමව සිතන සංවිධාන සමග කටයුතු කිරීම ඵලදායක බව අත්දැකීම පෙන්වා දෙයි.

කෙසේ වුවද, සහාය ලැබිය යුත්තන් වශයෙන් අදාළ අභ්‍යන්තර ක්‍රියාධරයින් නැතිනම් කළ යුත්තේ කුමක්ද? සාමාන්‍යයෙන් සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ සංකල්පය සලකන්නේ එය මුල සිටම පවතින සහ පාර්ශවික වශයෙන් සංවිධානය වූ එකක් වශයෙනිඃ එසේ වුවද, සංවිධානය වූ කණ්ඩායම් අදාළ ස්ථානයේ නැති වුවද සිවිල් සමාජයට සහය දීම කළ හැකිය යන්න සෝමාලියාවේ තත්ත්වය යළිත් වරක් පෙන්වා දෙයි.

1992 දී LPI තම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කරන විට ඉහත නිර්ණායක අනුරූප වූ දේශිය කණ්ඩායම් නොවීය. ඒ නිසා LPI සිය වැඩ පිළිබඳ ක්‍රියාත්මක කරනු පිණිස තමන්ගේම පුහුණු කරුවන් පුහුණු කරන අතරම, එතරම් පුහුණුවක් නැතත්, ගුරුවරුන් හා කලාකරුවන් වැනි පුද්ගලයන් හා කණ්ඩායම්වලට ද සහයෝගය ලබා දුනි. මෙහි වාසිදායක ප්‍රතිඵල ගණනාවක් ඇතඃ ගෝත්‍රික නොවන සහ කණ්ඩායම් පදනම් කරගත් පුද්ගලයන් එමගින් එකට එක් විය හැකිය.

විවිධ වූ මෙම මිනිසුන් එක් කිරීම එහි ස්වභාවයෙන්ම සන්ධානගත කිරීමේ අභ්‍යාසයක් බව ඔප්පු විය. කණ්ඩායම් ගොඩනැගීමට සමහරවිට වැඩමුළු පැවැත්වීම මගින් පහසුකම් සැලසෙන බව LPI තවදුරටත් සොයාගත්තේය. උදාහරණ වශයෙන් 1999 දී ජිබූටිහි රැස් වී 'සෝමාලි ආණ්ඩුව' ගොඩනැගූ නියෝජිතයින්ගෙන් සියයට පනහකට වැඩි පිරිසක් LPI විසින් පුහුණු කරන ලද්දවුන්ය යන කාරණය මගින් දක්නට ලැබුණු පරිදි, මෙම ප්‍රවේශයේ විශාලම ජයග්‍රහණය වූයේ මෙම ක්‍රියාධරයින්ගෙන් බොහෝ දෙනෙකු සාර්ථක ලෙස බල ගැන්වුණු බවයි.

## 2.5 කාලය නිශ්චය කිරීම : දීර්ඝ-කාලීන නියුක්තිය සහ ප්‍රස්තා දොරටුවල අවශ්‍යතාව

මැදිහත්වීමේ කාලය නිශ්චය කිරීම පිළිබඳ සාකච්ඡා ගැටුම් ව්‍යාවර්තනය සහ සාමය ගොඩනැගීම පිළිබඳ සාහිත්‍යයෙන් ප්‍රධාන කොටසක් අත්පත් කර ගනියි. වසර ගණනාවක් තිස්සේ පුද්ගලයින් ගැටුම් නිරාකරණය කිරීමේ ගැටලුව මුහුකුරා යාම විසඳීම සඳහා ගැටුම් සම්බන්ධයෙන් විවාද කොට ඇති අතර, මෙම 'මුහුකුරා යාම' අනුව සාම මැදිහත්වීමේ අනුරූප කාලය නිශ්චය කිරීමේ අවශ්‍යතාව ගැන සාකච්ඡා කොට ඇත. විසඳීම සඳහා ගැටුමක් මුහුකුරා ඇත්නම් පමණක් සාම මැදිහත්වීම් එම ගැටුම විසඳීමට දායක විය හැකියැයි සාර්ට්මන් සහ වෙනත් අය තර්ක කළහ (සාර්ට්මන් 1989: සටෙඩ්මන් 1991).



මුහුකුරා යාම පිළිබඳ මෙම සංකල්පය සහ එමගින් ඇති වී තිබෙන විවාදය යන කාරණා දෙක මෙම අවශ්‍යතාව පිළිබඳව ක්‍රියාධරයින් වඩාත් දැනුවත් කරන අතර, එහි ප්‍රායෝගික ප්‍රයෝජනය සීමා සහිත යැයි බොහෝ පර්යේෂකයින් එකඟත්වයට පත් කොට ඇත. මක්නිසාද යත්, මුහුකුරා යාම සාමාන්‍යයෙන් එසේ වූ පසු පමණක් විශ්ලේෂණය කළ හැකි වනවා සේම, ප්‍රතිඵලවල සාර්ථකත්වය පිළිබඳ ප්‍රශ්නයෙන් එය වෙන්කොට දැක්වීම අනුභූතිකව දුෂ්කරය. අවසානයේ දී එය පුනරුක්තියක් බවට පත් වේ: ගැටුම මෝරා නැත්නම් සාර්ථක සාම මැදිහත්වීමක් සඳහා අවස්ථාවක් නැත. සාම මැදිහත්වීම සාර්ථක වූයේ නම් ගැටුම මුහුකුරා තිබිය යුතුය (Kleiboer 1994). එසේම මුහුකුරා යාම පිළිබඳ මෙම සංකල්පය කෙරෙහි මතු පිටින් අවධානය යොමු කිරීම මගින් සිදුවන දෙයක් නම් මුහුකුරා යනතෙක් නොකඩවා බලා සිටින නිසා අක්‍රීයව සිටීමේ අනතුරකට බාහිර ක්‍රියාධරයින් මුහුණදීමය (Paffenholz 1998).

සාමය ගොඩනැගීම සඳහා වූ ව්‍යාවර්තන සහ ක්‍රියාවලි නැඹුරු ප්‍රවේශ විකාශය වීමත් සමග බොහෝ උගතුන් සහ වෘත්තිකයින් කෙරෙන් මුහුකුරා යාම පැසුණු බව පිළිබඳ සංකල්පයේ වැදගත්කම නැති වී ගොස් තිබේ. විවිධ වූ බොහෝ දේශීය සහ ජාත්‍යන්තර මැදිහත්වීම් මගින් සාමය ගොඩනැගීම සහ ගැටුම් ව්‍යාවර්තනය සඳහා කල්පවතින ව්‍යුහයන් ස්ථාපිත කිරීම පිණිස අවධානය දීර්ඝ කාලීන කටයුතු කරා විතැන් වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමස්ත ක්‍රියාවලියක් තුළ, නොයෙක් අවස්ථාවලදී කෙරෙන විවිධ වූ මැදිහත්වීම් රැසක එකතුව වශයෙන් වන දීර්ඝ කාලීන කාල රාමු දැන් සැලකිල්ලට ලක් වී තිබේ. සාර්ථක ගැටුම් ව්‍යාවර්තනයකට ප්‍රවේශ විය හැක්කේ මෙම විතැන් වීම මගින් පමණි (Fitzduff 2000).

මුහුකුරා යාම පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් මින් අදහස් කරන්නේ කුමක්ද? මේ පිළිබඳ පොදු එකඟතාව වන්නේ, මුහුකුරා යාම තවදුරටත් වලංගු සංකල්පයක් වුවද, එය සංස්කරණය කොට

වත්මන් සාම මැදිහත්වීම් පිළිබඳ යථාර්ථයට අනුවර්තනය කර ගැනීම අවශ්‍ය වේ යන්නයි. සියල්ලටම පළමුව 'මුහුකුරා ගිය මෙහොත' (Zartman 1989) නම් යෙදුම 'ප්‍රස්ථා දොරටු' දොරටු යන්න මගින් ආදේශ කළ යුතුය. මොහොත යන පදය ඉතා සුළු කාල සීමාවක් වන අතර එමගින් මැදිහත්වීම සඳහා ඇති අවස්ථා සීමිත බව ද හඟවයි. දොරටු විවෘත කොට වැසිය හැකි වන අතර, ඒ අනුව මැදිහත්වීම සඳහා වූ අවස්ථා යමින් එමින් පවතින බැවින් අඛණ්ඩව නිරීක්ෂණය කොට විශ්ලේෂණය කළ යුතුය යන යථාර්ථය නිරූපණය කරයි.

එසේම සාමය ගොඩනැගීම පිළිබඳ නූතන, ව්‍යාවර්තන නැඹුරු, ප්‍රවේශයන්ගේ යථාර්ථයන්ට මුහුකුරා යාම පිළිබඳ සංකල්පය තවදුරටත් අනුවර්තනය කර ගත යුතුය. ක්‍රියාධරයා මැදිහත්වීමට පෙරාතුව දොරටුව වැසී යා හැකි හෙයින්, දොරටුවක් සම්පූර්ණයෙන්ම විවෘත වන තෙක් සාම මැදිහත්කරුවන් කල් බැලිය යුතු නැත යන්න මේවා මගින් පැහැදිලි කෙරේ. ක්‍රියාධරයින් කාර්ය නියුක්තිය සහ ප්‍රස්තා සඳහා තිබිය හැකි දොරටු පිළිබඳව දීර්ඝ කාලීන හා ප්‍රාවර්තනීය විශ්ලේෂණය යන දෙක ඒකාබද්ධ කිරීම අවශ්‍යය. දීර්ඝ කාලීන නිරතවීම් මගින් පමණක් ක්‍රියාධරයින්ට මෙම ප්‍රස්තා දොරටු නිසි ලෙස හඳුනාගෙන ඒවා කාලීන ආකාරයට සාම මැදිහත්වීම් සඳහා යොදාගත හැකිවනු ඇත (Paffenholz 1998).

ගැටුමක් සාමකාමී ලෙස ව්‍යාවර්තනය වී, නිල සාම ගිවිසුමක් අත්සන් කරනු ලැබීමට පෙර, විවෘත වී වැසි යා හැකි ප්‍රස්තා-දොරටු ගණනාවක් නිතරම ඇති බව වෘත්තිකයින්ට දැකගන්නට ලැබී ඇත. අවසානයේ දී, ප්‍රස්තා දොරටු සාම නිවසේ බිත්තිවල ගඩොල් ලෙස දැකිය යුතු වේ. උදාහරණයක් වශයෙන්, ඔස්ලෝ ක්‍රියාවලිය වශයෙන් දැන් හැඳින්වෙන මැද පෙරදිග නෝර්වීජියානු මැදිහත්වීම, නෝර්වීජියානු රාජ්‍ය නොවන සංවිධානයක් විසින් හඳුනාගනු ලැබ නෝර්වේ විදේශ අමාත්‍යාංශය විසින් සහය දෙනු ලැබූ ප්‍රස්තා දොරටුවක් ඉතා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත් අස්ථාවකි. ඔස්ලෝ ක්‍රියාවලිය වැදගත් දොරටුවක් භාවිතයට ගත් බව කලාපයේ අලුත්ම වර්ධන පෙන්වා දෙන නමුත්, ලෝකයේ මෙම දුෂ්කර ප්‍රදේශයේ සාර්ථක ගැටුම් පරිවර්තනයක් විය යුතු නම්, තව කළ යුතු බොහෝ දේ ඇත.

## 2.6 ක්‍රියාවලි ඔස්සේ සිතීම සහ ව්‍යුහයන් ගොඩනැගීම

ඔස්ලෝ ක්‍රියාවලිය පිළිබඳ නිදර්ශනය, දීර්ඝ කාලීන ක්‍රියාවලි වශයෙන් සිතීමේ සහ සාමකාමී ගැටුම් ව්‍යාවර්තනය සඳහා අත්‍යවශ්‍ය ගතිකත්වතා ස්ථාපිත කරන ව්‍යුහ ගොඩනැගීමේ අවශ්‍යතාව ද පෙන්නුම් කරයි. ඔස්ලෝ ක්‍රියාවලියේ දායකත්වය සාම ගිවිසුමට එතරම් බද්ධ නොකෙරුණු අතර, එය ඊට වඩා ක්‍රියාවලිය ආරම්භයේ විට ස්ථාපිත කරන ලද සාමය ගොඩනැගීම සඳහා වූ ව්‍යුහයන් හා බද්ධ කෙරිණි.

ගැටුම් ව්‍යාවර්තනයට පහසුකම් සලසන ක්‍රියාවලි සහ ව්‍යුහ පිළිබඳ තවත් නිදර්ශනයක් නම්, පුළුල් පරාසයක ගැටුම් ක්‍රියාධරයින් සහිතව මොසැම්බික් හි සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයට මග පෑදූ ක්‍රියාවලියෙහි සාර්ථක මැදිහත්වීමයි. විශේෂයෙන්ම පසුබැම්වලින් යුක්ත අදියරයන්හිදී අනර්ඝ යැයි ඔප්පු කෙරුණු, මැදිහත්වීමේ විවිධ මට්ටම්වලදී මැදිහත්වීමේ ව්‍යුහයන් සහ සාම

ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට මොසැම්බික්හි ඇතුළත සිට සහ පිටත සිට, එක්ව කටයුතු කළ පථ I සහ II හි විවිධ ක්‍රියාධරයෝ ගණනාවක් සමත් වූහ. 1992 දී ගිවිසුම අත්සන් කරනු ලැබූ පසුත් මෙම ව්‍යූහ අඛණ්ඩව පැවැතීම නිසා ද මොසැම්බික් ක්‍රියාවලිය විශිෂ්ටය (Paffenholz 2000a). 1992 සිට ප්‍රාදේශීය මට්ටමෙන් ප්‍රචණ්ඩ තර්ජන ගණනාවක් ඇති වුවද, මැදිහත්වීම් ක්‍රියාවලියේ කාලය තුළ ස්ථාපිත කරන ලද ගැටුම් ව්‍යාවර්තන ව්‍යූහය ප්‍රධාන පාර්ශවකරුවන් කිසිවෙකු මොසැම්බික් හි යළි යුද්ධයකට යාම ගැන බැරෑරුම් ලෙස නොසිතන බව නොකඩවා සහතික කරමින් සිටියි (Paffenholz 2000 b).

ඵලදායී ගැටුම් ව්‍යාවර්තනය සඳහා නම්‍යශීලී නමුත් කල් පවතින ව්‍යූහයන් අවශ්‍ය බව මෙම නිදර්ශන පෙන්නුම් කරයි. මෙම ව්‍යූහ ස්ථාපිත කිරීම මගින් ක්‍රියාත්මක කල්පවතින සාම ක්‍රියාවලීන්හි මට්ටමෙන් මෙන් ම සාර්ව (උපරිම) මට්ටමෙන් ද මෙය කළ යුතුය. දෙවැන්න සලකා බලන කල, මැදිහත්වීම්වලදී ගොඩනැගිය යුතු සාමය ශක්තිමත් කිරීමේ ව්‍යූහ හතරක පද්ධතියක් ලූක් රෙක්ලර් (2000, පිටුව 12) යෝජනා කරයි:

*පළමු වැන්න දේශපාලන ස්වභාවයේ එකකි: එය තහවුරු වූ ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කිරීමයි: එවැනි ප්‍රජාතන්ත්‍රවාදයක ගොඩනැගිලි දහයක් සහ අභ්‍යන්තර සහ බාහිර සහායක පද්ධතීන් ඇතුළත්ය. කල් පවත්නා සාමයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය දෙවැනි ව්‍යූහය වන්නේ සාර්ථක, නීත්‍යානුකූල සහ ප්‍රතිශක්ති දායක අධිකරණ පද්ධතියකි. ප්‍රතිශක්තිදායක අධිකරණ පද්ධතියක් නිර්මාණය කිරීම හොවාර්ඩ් සෙහ්ර් විසින් ප්‍රබල ලෙස අවධාරණය කරන ලද්දකි. ගොඩනැගිය යුතු තුන්වැනි ව්‍යූහය සමාජමය වූ නිදහස් වෙළඳපොළ ක්‍රමයකි. මධ්‍යගත නිදහස් පිරිසිදු වෙළෙඳපොළ ආර්ථික පරිසරයකට වඩා සමාජමය නිදහස් වෙළඳපොළක කල් පවත්නා සාමය ස්ථාපිත කිරීමේ අවස්ථාවන් බොහෝය. වඩාත් වැදගත් වන්නේ, පෞද්ගලීකරණ ක්‍රියාවලියක් සහ වේගවත් ආර්ථික සමාජයක් ගොඩනැගීමයි. අවධානය යොමු කළ යුතු සිව්වැනි ව්‍යූහය වන්නේ අධ්‍යාපනය, තොරතුරු සහ සන්නිවේදන පද්ධතියයි. මෙහිදී අපි පාසල් අධ්‍යාපනයේ මට්ටම, විචක්ෂණ මට්ටම, විෂයයන්ගේ අදාළත්වය සහ දරන ආකල්ප, ජනමාධ්‍ය පාලනය, ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තික මට්ටම, ගැටුම් ව්‍යාවර්තනයේදී ජනමාධ්‍ය ඉටු කරන ධනාත්මක කාර්යභාරයේ ප්‍රමාණය සහ විනාශකාරී කටකතා පාලනය යන කාරණා දෙස නෙත් යොමු කරන්නෙමු. අවසානයේ දී මෙම ව්‍යූහ සතුටුදායක ආකාරයකට සරනාගතියන්ගේ ප්‍රශ්නයට මුහුණදීම සඳහා අවශ්‍ය වේ.*



## 2.7 නිසි පුද්ගලයින් සොයා ගැනීම: සුදුසුකම්වලට එරෙහි කැපවීම

මැදිහත්වීමේ සෑම මට්ටමකදීම සුදුසුකම් ඇති සහ කැපවීමෙන් යුත් කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වනු ඇත: අන් සියල්ලම වඩා සාමය ගොඩනැගීම සඳහා මෙම ගුණාංග දෙක අත්‍යවශ්‍යය (Mott Foundation 1999). අර්බුද කලාපවලට ආවේණික දුෂ්කර පුද්ගලික සහ වෘත්තීය අභියෝග සාර්ථක ලෙස ජයගැනීමට සුදුසුකම් පමණක් ප්‍රමාණවත් නොවේ; ක්‍රියාධරයෙකු සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයකට අර්ථවත් ලෙස දායකත්වය සපයන්නකු වීමට නම් කැපවීම, විවෘත බව, නම්‍යශීලී බව සහ ආත්ම විශ්වාසය යනාදිය පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. දැඩි පුහුණුව මගින් මේ ගුණාංග දෙකේ සංකලනයක් සොයාගත යුතුය.

එවැනි පුද්ගලයින් සොයා ගැනීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් බඳවා ගැනීමේ මනා ක්‍රියාවලියක් අත්‍යවශ්‍යය. අපේක්ෂකයින්, සිය අභිප්‍රායයන්, කැපවීම්, අත්දැකීම, අධ්‍යාපනය සහ පුහුණුව, කුසලතා සහ සුදුසුකම් පිළිබඳව තමන් ගැනම ලිවිය හැකි විස්තරාත්මක අයදුම්පතක් ඔවුනට ලබාදීම ද ඇතුළත් විය යුතුය. එවැනි වැඩි විස්තර ලබාගත හැකි තොරතුරු ලබා දෙන පුද්ගලයින් වෙතින් ප්‍රතිපෝෂණ ලබාගැනීම ද ඉන් අවධාරණය කළ යුතුය. නිසි බඳවා ගැනීමකට පෞද්ගලික සම්මුඛ සාකච්ඡා මෙන්ම බඳවා ගැනීමේ සම්මන්ත්‍රණය ද ඇතුළත් කළ යුතුය (Kruhonja 2000).

**කොටුව 2 ෴ යු. ආ. ස. ස. (OSCE) දූත මණ්ඩල සාමාජිකයින් - පොදු අවම අවශ්‍යතා**

ඕනෑම යු. ආ. ස. ස. ක්ෂේත්‍ර මෙහෙයකට සුදුසුකම් සඳහා යු. ආ. ස.ස. අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතා සපුරා සිටීම අවශ්‍ය වේ.

- ඉංග්‍රීසියෙන් වැඩ කිරීමේ හැකියාව;
- ඉතා හොඳ ශාරීරික තත්ත්වය;
- වලංගු රිය පැදවීමේ බලපත්‍රයක් අයත්ව සිටීම සහ අත් ගියර සහිත රිය පැදවීමේ හැකියාව;
- වර්ඩ් ප්‍රොසෙසින් සහ ඊ මේල් ඇතුළු, වින්ඩෝස් ක්‍රම ක්‍රියාත්මක කිරීමේ හැකියාව;
- අපක්ෂපාතීත්වය සහ විෂය මූලිකත්වය පවත්වා ගෙන යන අතරම, විවිධ සංස්කෘතික සහ ආගමික පසුබිම් ඇති, වෙනස් ලිංග සහ වෙනස් වූ දේශපාලන මත දරන මිනිසුන් සහිත කණ්ඩායමක සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට ඇති ප්‍රකාශිත හැකියාව සහ කැමැත්ත;
- සංස්කෘතික සංවේදීභාවය සහ විචාර බුද්ධිය;
- නම්‍යශීලීභාවය සහ පීඩනකාරී තත්ත්වයක් සහ සීමිත කාල රාමුවක් තුළ වැඩ කිරීමේ හැකියාව;
- ශාරීරික දුෂ්කරතාවන්ට මුහුණදීමේ හැකියාව සහ අමතර කාලයක් සීමිත යටිතල පහසුකම් සහිත පරිසරයක වැඩ කිරීමේ කැමැත්ත;

අපේක්ෂා කටයුතු,

- ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පූර්ව අත්දැකීම සහ / හෝ ක්ෂේත්‍ර මෙහෙවර අත්දැකීම;
- වෙනත් භාෂා දැනුම;
- කළමනාකරණ සහ අධීක්ෂණ අත්දැකීම;
- සාකච්ඡා / මැදිහත්වීම් අත්දැකීම.

(මූලය ෴ OSCE 2000)



එසේ වුවද, අදාළ සියලුම නිර්ණායකයන් සපුරන අපේක්ෂකයින් සොයාගැනීම අතිශයින්ම දුෂ්කර බව පෙනේ. එහෙයින්, හොඳ කණ්ඩායම් බඳවා ගැනීම සියල්ලටම වඩා අත්‍යවශ්‍යය, මක්නිසාද

යත්, කණ්ඩායමක් තුළ පුද්ගල දුර්වලතා හිලව් කළ හැකි නිසාය. සුපිරි කාන්තාව හෝ සුපිරි මිනිසා සොයනවාට වඩා සිහින කණ්ඩායම සොයාගැනීම නිවැරදි ප්‍රවේශය සේ පෙනේ. බොහෝ අවස්ථාවලදී බඳවා ගැනීම වෘත්තිය සුදුසුකම් කෙරෙහි පමණ ඉක්මවා අවධානය යොමු කරයි; බොහෝ සංවිධානවල පෙළඹීමේ වැදගත්කම අඩුවෙන් තක්සේරු කෙරේ. එහෙත් අත්දැකීම් පෙන්වා දෙන්නේ, අඩු තරමින් අර්බුදකාරී ප්‍රදේශවල වැඩ කරන විට හෝ පුද්ගල සීමාවල ප්‍රතිඵල වශයෙන් ගැටුම් ව්‍යාවර්තනය වෙනුවෙන් සංවිධාන සපයන දායකත්වයට සීමා පැනවෙන බැවින් පෞරුෂත්වය වැදගත් සේ සැලකිය යුතු බවයි (Kramer 2001).

## 2.8 සහයෝගීතාව සහ සම්බන්ධීකරණය: සාමය ගොඩනැගීම සඳහා ඖපායික සන්ධාන හඳුනා ගැනීම

සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය පිළිබඳ තේමා වටා ඇති බොහෝ සත්‍යයන් සාහිත්‍යය ලබා දෙයි. සම්බන්ධීකරණය පිළිබඳ කාරණයේදී මැදිහත්වීමේ සෑම මට්ටමකමක සිටින බොහෝ වෘත්තිකයෝ සහ ක්‍රියාධරයෝ එහි ප්‍රයෝජනය ගැන විශ්වාසය තබති; එහෙත්, භාවිතයේදී සම්බන්ධීකරණය කිසිදාක ක්‍රියාත්මක නොවන තරම්ය. සෑම කෙනෙකුටම සම්බන්ධීකරණය අවශ්‍ය වේ, එහෙත් කිසිවෙකුට සම්බන්ධීකරණය වීමට අවශ්‍ය නැත !

විවිධ වූත් බහුවිධ අවධානයෙන් යුත් වුත් මැදිහත්වීම් කාලයක් තිස්සේ තිබීම පමණක් සැබෑ කල්පවත්නා ගැටුම් ව්‍යාවර්තනයකට මගපාදනු ඇතැයි පර්යේෂණ ප්‍රතිඵල මගින් තහවුරු කර ඇත (Fitzduff 2000; Paffenholz 2000a). එසේ වුවද, මෙම විවිධ වූ සියලු ක්‍රියාධරයින් අතර සම්බන්ධීකරණය ක්‍රියාකාරකම්වලට අමතර වටිනාකමක් ලබාදෙන බව මේ ප්‍රතිඵල සඳහන් කරන්නේ නැත. එසේම, යම් යම් පූර්ව කොන්දේසි ඉටු වුවහොත් පමණක් මෙම සම්බන්ධීකරණය ඵලදායක වේ. වඩාත් වැදගත් දේ නම්, සම්බන්ධීකරණයේ අරමුණ පැහැදිලි වීම අදාළ සෑම ක්‍රියාධරයකු විසින්ම අගය කරනු ලැබිය යුතුවීමය.



ප්‍රචණ්ඩ ගැටුම් ඇති බොහෝ ප්‍රදේශවල එක්කෝ දූනටමත් සාම සාධක මෙහෙවරක් ක්‍රියාත්මක වේ. එසේ නැත්නම් අඩු තරමින් සාම හෝ සහනාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාහිර ක්‍රියාධරයෝ ගණනාවක් ක්‍රියා කරමින් සිටිති. සාම සාධක මෙහෙයුමක් ඇත්නම්, සාමාන්‍යයෙන් එය සම්බන්ධීකරණ කාර්යාලයක් ස්ථාපිත කොට තිබිය හැකිය. මෙවැනි අවස්ථාවලදී මෙම මෙහෙයුම් ඒකාබද්ධ කරන්නට හොඳම ක්‍රමය ලෙස උපායයන් සකස් කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන එක්තරා ආකාරයක උපායශීලී සන්ධාන බවට සංවිධානය වීම අනිවාර්යය.

රාජ්‍ය නොවන සංවිධාන වෙතට නැඹුරු වනුයේ සහයෝගීතා සංස්කෘතීන්ට වඩා තරග සංස්කෘතීන් වන නිසා සෑම විටම මෙය පහසු කටයුත්තක් නොවේ. මෙහි දී, යුද කලාපයක සාමයට සහ ස්ථාවරත්වයට සහය වීම සඳහා වූ කැපවීම, සෑම පාර්ශවයකම ගැටුම්කාරී චර්යාව යටපත් කරමින් එකට බැඳ තැබීමේ බලවේගය බවට පත් විය යුතුය. සාමාන්‍යයෙන් රටක විවිධ බිම් මට්ටමේ තත්ත්වයන් සම්බන්ධයෙන් වූ වඩාත් ගැඹුරු තොරතුරුවලට ළඟා වීමට රාජ්‍ය ආයතනවලට සාපේක්ෂව රාජ්‍ය නොවන සංවිධානවලට වැඩි හැකියාවක් ඇත. සාමාන්‍යයෙන් බොහෝ දූත කණ්ඩායම් මෙම තොරතුරු

තමන්ගේ අරමුණු සඳහා යොදාගැනීමට උත්සාහ කරනු ඇත. පථ I, II *සහ* III *හි* ක්‍රියාධරයින් ඵලදායී ලෙස සහයෝගී වන්නේ නම් අදාළ භූමිකා සහ චර්යා පිළිබඳ පැහැදිලි නිර්වචනයක් සැපයීම අනිවාර්ය පූර්ව කොන්දේසියක් වේ.

යම් යම් මූලික පියවර ගැනීම මගින් සාමකාමී ගැටුම් ව්‍යාවර්තනයක් සඳහා වූ සිය දායකත්වය උපරිම කළ හැකි බව හොඳින් සංවිධානය වූ රාජ්‍ය නොවන සංවිධාන දැනගනු ඇත. සාර්ථක සම්බන්ධීකරණයක් වර්ධනය කිරීම සඳහා පළමු පියවර විය හැක්කේ මුල් පෙළේ ක්‍රියාධරයෙකු පත් කර ගැනීමයි. දෙවනුව, බාහිර සම්බන්ධීකරණ ප්‍රයත්නයන්හි නිරතවීමට පෙරාතුව සංවිධාන සිය අභ්‍යන්තර සම්බන්ධීකරණ පද්ධති ශක්තිමත් කරගත යුතුය. අවසානයේදී නිල සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීමට වඩා, නිශ්චිත අරමුණු සඳහා වූ සැලසුම් කරන ලද, පිළිවෙලකින් තොර කාර්ය සාධක කණ්ඩායම් කෙරෙහි විශ්වාසය තැබීම සුදුසු බව මෙම සංවිධානවලට අවබෝධ විය හැකිය.

ජාත්‍යන්තර මෙහෙවර ක්‍රියාත්මක නොවන්නේ නම් වෙනස් වූ තත්ත්වයන් දෙකක් දැකිය හැකි වේ. තම කටයුතුවලට ආධාර කිරීම සඳහා එක්තරා ආකාරයක ක්‍රියාකාරී ව්‍යූහයක් ගොඩනගා ගැනීමට ඇති එකම ක්‍රමය මෙයයි යන්න පිළිගැනීම නිසා අදාළ ස්ථානයේ රාජ්‍ය නොවන සංවිධාන එකිනෙකා අතර, සහයෝගයෙන් කටයුතු කරනු ඇත, එසේ නැතිනම් නොකඩවාම වැඩි වැඩියෙන් රාජ්‍ය නොවන සංවිධාන එහි වැඩ කටයුතු කිරීමට ඇදී එන තරමට ගැටුම් ප්‍රදේශය ඉතාමත් 'ජනප්‍රිය' වනු ඇත. මෙය සාමාන්‍යයෙන් හොඳ සම්බන්ධීකරණයකට බාධා කරයි. එසේ වුවද, තොරතුරු හුවමාරු කර ගැනීමේ සහ ආරක්ෂක විධි විධාන පිළිබඳ අරමුණ වෙනුවෙන් පමණක් හෝ ක්‍රියාධරයින් එක්තරා ආකාරයක සම්බන්ධීකරණයක නිරත විය යුතුය.



සම්බන්ධීකරණයට හොඳම මඟ වැටී ඇත්තේ සාමය හා ගැටුම් ව්‍යාවර්තනයට උපකාරී වන සෑම මට්ටමක ක්‍රියාකාරීන් සියලු දෙනාම ඇතුළත් ව්‍යූහයක් ගොඩ නැගිය හැකි සන්ධානයක් හරහාය. ඉහත පෙන්නුම් කර ඇති පරිදි බෝහෝ රාජ්‍ය නොවන සංවිධාන වල ඇති එකිනෙකාට එරෙහි හැසිරීම් හමුවේ මෙය ලෙහෙසි කටයුත්තක් නොවේ. අතිශයින්ම ප්‍රචලිත බෝහෝ ගැටුම් කලාපීය සම්බන්ධීකරණ කටයුතු අසීමිත අයුරින් ආරාක්ෂාව හා මානුෂික අංශ කෙරෙහි පමණක් යොමු වන අතර සාමය ගොඩනැංවීමේ කටයුතු නොසලකා හැර ඇත.

සාම ක්‍රියාවලියට ආධාරවන ව්‍යූහයන් ස්ථාපිත කිරීම ඒ අනුව ඉතා වැදගත් මෙවලමකි. පරමාදර්ශී වශයෙන් එබඳු ව්‍යූහයක් තුළ විවිධ කාර්ය ඉටුවිය යුතුය.

- සම්බන්ධ වී සිටින සියලු බාහිර ක්‍රියාධරයින් ලියාපදිංචි කිරීම;
- පථ I සහ II හා III අතර සංවාදය;
- තොරතුරු බෙදාහදා ගැනීම;
- ගැටුම් ව්‍යාවර්තනය සඳහා විභව ශක්තියෙන් යුත් සංවාදය;
- ශ්‍රම විභජනය;
- අදාළ අභ්‍යන්තර ක්‍රියාධාරීන් හා අත්වැල් බැඳ ගැනීම;
- 'අනිසි පුද්ගලයින්' (අභ්‍යන්තර හෝ භාහිර) පසෙකට තල්ලු කිරීම;
- ගැටුම් අවස්ථාව තුළ සාමය ගොඩනැංවීමේ ව්‍යූහවලට ආධාර දීම;

යළිත් සොමාලියාවෙහි LPI අත්දැකීම සහයෝගීත්වය හා සම්බන්ධීකරණය පිළිබඳ දුෂ්කරතාව පෙන්වා දෙයි. LPI සහ සෝමාලියාවේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම (UNOSOM),මැදිහත්වීමේ සියලු මට්ටම්වල පාර්ශවකරුවනට ඇති දුෂ්කර අභියෝග අන්තර්ගත ක්‍රමෝපායික ක්‍රියාදාමයක නිරත විය. මෙම ක්‍රමෝපායික සන්ධානය LPI සඳහා වාසිදායක වුයේ එයට සෝමාලියාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ තීරණ ගැනීම කෙරේ බෙහෙවින් බලපෑම් කිරීමටත්, එ මගින් සමස්ත සාම ගොඩනැගමට දායක වීමට ඉඩ සැලසුණු බැවිනි. එසේ වුවත්, LPI බිම් මට්ටමමේ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන සමඟ එබඳු උපායමය සන්ධානයක් ගොඩනගා ගත්තේ නම් ඔවුන්ගේ ප්‍රයත්න වඩාත් අර්ථවත් වීමට ඉඩකඩ තිබිණි.

මෙම අත්දැකීමේ ප්‍රතිඵලය LPI වෙනුවෙන් දෙයාකාර විය. එක් අතකින්, වර්ධනය වෙමින් පැවති මැදිහත් වීමේ ක්‍රියාකාරී මණ්ඩලය සමඟ තවදුරටත් සහයෝගීත්වය හා සම්බන්ධීකරණය පවත්වා ගැනීම ගැන LPI වඩ වඩාත් විවේචනාත්මක විය. අනිත් අතට LPI හි මෙම සැක සහගත බව නිසා, සිවිල් සමාජය සඳහා නියෝජිතයෙකු වශයෙන් එය මගින් අනිසි පුද්ගලයන් කාර්යසාධක පාර්ශවකාර තත්වයෙන් පසකට තල්ලු කිරීම සඳහා වෙනසකින් තොරව අවානම් ඉඟි යැවීම් වශයෙන්, ධනාත්මක බලපෑමක් ඇති විය.

## 2.9 ක්‍රියාවලිය තිරසාර බවට පත් කිරීම

ආරම්භයේ සිටම තිරසාර බවේ අරමුණ මැදිහත්වීමේ සැලැස්ම තුළට බද්ධ කිරීම අවශ්‍යය. මැදිහත්වීමේ විවිධ මට්ටම් සඳහා විවිධ උපායයන් අවශ්‍ය වේ. උපරිම මට්ටමේ දී අපට කෙටි කාලීන සහ දීර්ඝ කාලීන මැදිහත්වීම් වෙන් කොට දැක්විය හැකිය - උදාහරණයක් වශයෙන් අරමුදල් සැපයීමේ වගකීම් සම්බන්ධයෙන් එසේ කළ හැකිය. සුහද නිල කටයුතු, පහසුකම් සැලසීම සහ මැදිහත්වීමේ ප්‍රයත්න වැනි කෙටිකාලීන මැදිහත්වීම් තිරසාර බව සාකච්ජාව සඳහා සලකා බැලිය යුතු නිර්ණායකයක් වශයෙන් ඇතුළත් කළ යුතුය (Paffenholz 1998). තවද, සාර්ව (උපරිම) මට්ටමේ මැදිහත්වීමේ ක්‍රියාධරයින් සිය මැදිහත්වීමට පෙරාතුවම පිටවීමේ උපාය මාර්ගයක් ද සකස් කරගත යුතුය (CAII 2000). මින් අදහස් කෙරෙන්නේ, උදාහරණයක් වශයෙන්, සුදුසු අවස්ථාවේ දී බාහිර මැදිහත්වීමේ ක්‍රියාධරයින් දේශීය ක්‍රියාධරයින්ට හෝ වෙනත් බාහිර ක්‍රියාධරයින්ට මැදිහත්වීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යාමට ඉඩ හැරීමට සූදානමින් සිටිය යුතුය යන්නයි. ක්‍රියාවලිය තිරසාර එකක් විය යුතුවා විනා බාහිර ක්‍රියාධරයාගේ මැදිහත්වීම තිරසාර එකක් නොවිය යුතුය!



මැදිහත්වීමේ සියලුම මට්ටම්වල දී මැදිහත්වීම කල්පවත්නා එකක් විය හැකිය යන්න සහතික කිරීම ආධාර දෙන ආයතනවලට ද වැදගත්ය. ඔවුනට මෙය ඉටුකර ගැනීම සඳහා සරල යාන්ත්‍රණ දෙකක් ඇත. පළමුව ක්‍රියාත්මක කිරීමේ වගකීම භාරගත් නිශ්චිත පුද්ගලයින්ට නිශ්චිත කාර්යයන් පැවරීම ඇතුළු පූර්ව නිර්මිත යාන්ත්‍රණය අත්‍යවශ්‍ය ය. මේ සියලුම පාර්ශවයන් විසින් පසු-කාර්ය යාන්ත්‍රණයකින් සම්පූර්ණ වූ ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. දෙවනුව, අදාළ කොට්ඨාසයට අඛණ්ඩව ප්‍රතිපෝෂණය සපයනු සඳහා ගොඩනැගුණු නිරීක්ෂණ පද්ධතියක් සකස් කරගත යුතුය. විශ්වාසය ගොඩනැගීම සඳහාත් සබඳතා ගොඩනැගීම සාර්ථක වීම සඳහාත් ප්‍රතිචාර්තාකරණ යාන්ත්‍රණයක් අත්‍යවශ්‍යය. මේ සඳහා අයිතිවාසිකම් කීම මෙයින් තවදුරටත් සහතික කෙරෙන අතර, එය තිරසාර බව සඳහා වන හොඳ ම සහතිකයයි.

උදාහරණයක් වශයෙන්, ගැටුම් පවතින ප්‍රදේශවල සිවිල් සමාජ බල ගැන්වීමේ පුහුණු වැඩසටහන් තිරසාර බව පිළිබඳව ප්‍රමාණවත් තරම් අවධානය යොමු කරන්නේ නැත. ජනතාව බල ගැන්වීමේ මෙම මතය මූලික වශයෙන් නිවැරදි සහ ශක්තිමත් එකකි. එහෙත් එය නිශ්චිත වශයෙන්ම තිරසාර බව ලබා ගැනීම ඉලක්ක කරගත් යම් ආකාරයක ක්‍රමවේදයක් ද ඇතුළත් කරගත යුතුය. බලගැන්වුමෙහි ප්‍රතිඵලය දීර්ඝකාලීනව කාන්දු වීම කෙරෙහි විශ්වාස කරන අතරම තිරසාර බව සඳහා වූ ඵලදායී මාධ්‍යම-කාලීන උපායයන් සැලසුම් කිරීම ද අත්‍යවශ්‍යය. ජනතාව බලගැන්වීම නිවැරදි ප්‍රවේශයක් වුවත්, මෙම ක්‍රියාවලීන් තිරසාර වන්නට නම් මෙම ජනතාවට තිරසාර ව්‍යුහයක් ද අවශ්‍යය. කෙටිකාලීන තත්ත්වයේ සිට මධ්‍යකාලීන තත්ත්වය දක්වා පුහුණුවෙන් ප්‍රයෝජනයක් ඇත. දේශීය කණ්ඩායම්වල අවශ්‍යතාවන්ට නම්‍යශීලී ප්‍රතිචාරයක් සහතික කළ හැකි සහ අවසානයේ දී සාමකාමී ගැටුම් ව්‍යාවර්තනය සඳහා තිරසාර දේශීය ව්‍යුහයන් ස්ථාපිත කිරීමට මඟ පාදන සුදුසු පසු කාර්ය යාන්ත්‍රණ ගොඩනැගීම මගින් මෙය ඉටු කරගත හැකිය.

ක්‍රියාවලීන් වඩාත් තිරසාර තත්ත්වයට පත් කරන තවත් ප්‍රවේශයක් නම්, සුදුසු ජාල සහ සහායක හවුල්කරුවන් හඳුනා ගැනීම මගින් ඒවාට ආධාර කිරීමයි. එසේ වුවද, සහයෝගීතාවේ නාමයෙන් සහයෝගය දීමේ ප්‍රයෝජනයක් නැත. අනෙක් අතට, සම්බන්ධීකරණය සහ සහයෝගය දීම තහවුරු කළ යුත්තේ අදාළ සියලුම හවුල්කරුවන්ට අමතර වටිනාකමක් ඇත්නම් පමණි. එහෙත්, ආධාරක ව්‍යුහයන් මගින් වැඩසටහන් තිරසාර කර ගැනීම සඳහා උපායික සන්ධානවල ප්‍රයෝජනවත්භාවය විස්තර කිරීම නිතරම අවශ්‍යය.



## 2.10 උගැන්මේ යාන්ත්‍රණ ඇතුළත් කර ගැනීම

ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍රයේ හෝ සාමය ගොඩනැගීමේ ක්ෂේත්‍රයේ වැඩ කිරීම විශාල දැනුම් සම්භාරයක් ලබාදෙයි. එහෙත් මෙම පාඩම් ඉගෙන ගන්නේ පුද්ගලයින් විනා සංවිධාන හෝ ආයතන හෝ නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පුද්ගලයින් සංවිධානය හැර යන විට ඔවුන් උගත් පාඩම් ද නිතරම ඔවුන් සමගම අතුරුදහන් වන අතර, ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් එම පාඩම් අලුතින් ඉගෙන ගත යුතුය. විශාල සංවිධානවල ඇගැයීම් ඒකක සතුව ද විශාල දැනුම් එකතුවක් ඇති මුත්, ඔවුන් ඉගෙන ගන්නේ ඔවුන් ඇගැයීමට ලක් කළ තනි සිදුවීම් මගිනි. අද දක්වාත් සංවිධානයේ සාමූහික ඉගෙනීම කෙරෙහි යොමු කොට ඇත්තේ අඩු සැලකිල්ලකි.

නව මූලික කියමන දැනුම් කළමනාකරණයයි. දැනුම සහ කළමනාකරණය යන දෙක සඳහාම සමාන ක්‍රමවේදයන් තිබුණ ද ඉගෙනුම් කළමනාකරණය සහ පුළුල් දැනුම් කළමනාකරණ සංකල්පය අතර වෙනසක් ඇත.

මැදිහත්වීමේ සෑම මට්ටමකදීම ඉගෙනුම් ක්‍රියාවලියක් ඇති කිරීම අත්‍යවශ්‍යය. ඇගැයීම දිගු කලක් තිස්සේ ආධාර දෙන ප්‍රජාව තුළ ඉගෙනීම පොදු මෙවලමක් බවට පත්වී තිබෙන අතර, ඉහළම මට්ටමෙන් ඉගෙනීම මෙතෙක් මැදිහත්වීමේ ක්‍රියාවලියේ අඛණ්ඩ කොටසක් බවට පත් වී නැත. ඒ වෙනුවට පර්යේෂකයන් විසින් සාර්ව (ඉහළම) මට්ටමේ මැදිහත්වීම් පිළිබඳ නිතරම පාහේ ඉගෙන ගන්නේ ක්‍රියාවලිය සමග පෞද්ගලික සබඳතාවක් නැතිව සිද්ධීන්ගෙන් පසුවය. ඉගෙනීම නිතරම

වැඩසටහන්වල සහ ව්‍යාපෘතිවල කොටසක් වුවද, ඒවා ක්‍රියාත්මක වන ක්‍රියාවලි තුළට ඒකාබද්ධ කරනු ලැබ නැති හෙයින් පාඩම් ඉගෙනීම කෙරෙන්නේ නැත.

එහෙයින් සෑම මට්ටමකදීම ස්ථාවර ස්වයං-අගැයීමක් කරමින්, (Smillie and Helmich 1999) හෝ අඩු කරමින් එක්තරා ආකාරයක ප්‍රත්‍යවේක්ෂණ හෝ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියක් සැලසුම් කරමින්, මැදිහත්වීම, පර්යේෂණ සහ විශේෂඥතා හැකියා සමග බද්ධ කිරීම සුදුසුය. තවත් විකල්පයක් නම්, ලේඛන සකස් කිරීමට සහ ඉගෙනීමට සමත්වන හවුල්කරුවන් සමග උපායික සන්ධානයක නිරත වීමයි. ඉගෙනීම කෙරුණේ කෙසේද යන්න වැදගත් නොවේ; වැදගත් වන්නේ ප්‍රතිඵල ස්ථාවර ලෙස ලිඛිතව යාවත්කාලීන කිරීම සහ ඉගෙනීම යනු හුදු ලේඛනාගාරය සඳහා වූ දෙයක් නොව, මැදිහත්වීමේ ක්‍රියාවලියේ අඛණ්ඩ කොටසක් යැයි මෙම කටයුත්තේ නිරත අය අන්‍යොන්‍ය වශයෙන් අවබෝධයක් ලබා ගැනීමයි (Paffenholz 2000 b බලන්න).

## 3. ඉදිරියේ ඇති අවිනිශ්චිත ප්‍රශ්න සහ අභියෝග

පසුගිය දස වසර තුළ සාමය ගොඩනැගීමේ සහ ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍රයේ විද්වත් සහ වෘත්තික ප්‍රජාවන් දෙකම තම තමන්ගේ ක්ෂේත්‍රයේ වඩාත් සාර්ථක ලෙස වැඩ කිරීම සඳහා වූ පරාමිතීන් සහ කොන්දේසි පිළිබඳව බොහෝ සෙයින් ඉගෙන ගෙන ඇත (මෙම වෙළුමේ Kevin Clements ගේ දායකත්වය බලන්න). මාගේ නිරීක්ෂණය අනුව තම දෛනික කටයුතුවලදී මෙම දැනුම ප්‍රමාණවත් ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් ක්‍රියාධරයින් වළක්වන්නා වූ අවිනිශ්චිත ප්‍රශ්න ගණනාවක් ඇත.



පළමුව, වෙනත් අවස්ථා ගැන ඉගෙන ගන්නා පාඩම් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමේ දී සැලකිය යුතු තරම් හිඩැසක් තවමත් ඇත. පර්යේෂණ ප්‍රජාව විවිධ වූ බොහෝ සාම ක්‍රියාවලීන් විශ්ලේෂණය කොට එමගින් අතිවිශාල අත්දැකීමක් ලබා ඇත. ඇත්ත වශයෙන්ම අධ්‍යයනය නොකරන ලද සන්නද්ධ ගැටුමක් නැති තරම්ය. සාමය ගොඩනැගීම සහ ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ සංකල්පමය ප්‍රවේශ රාශියක් ඉදිරිපත් කරමින්, බොහෝ පොත් ලියැවී ඇත. එහෙත් අපට නැත්තේ මේ සියලු දැනුම ඒකරාශී කිරීම සඳහා වූ ක්‍රමානුකූල පුළුල් පර්යේෂණයකි. එවැනි විශාල, පුළුල්, විද්වත්, මෙහෙයක් සඳහා ආධාරකරුවන් විසින් අරමුදලක් පිහිටුවීමට දැන් කාලය එළැඹ තිබේ.

සාම පර්යේෂකයින් සාමය ගොඩනැගීම පිළිබඳ ධනාත්මක නිදර්ශන පිළිබඳ වැඩියෙන් තොරතුරු ලබාගැනීමේ අවශ්‍යතාව නිතරම අවධාරණය කොට ඇත. ඇත්ත වශයෙන්ම, විවිධ අර්බුද ප්‍රදේශවල කටයුතු කිරීමේදී, අපට දේශීය සංවිධාන අතරින් ප්‍රයෝජනවත්, මනා, නිදර්ශන කොතරම් සංඛ්‍යාවක් සොයාගත හැකිද යන්න මවිත කරවන සුලුය. අවාසනාවකට මෙම දැනුමෙන් යම් ප්‍රමාණයක් හෝ ලේඛනගත කොට නැති අතර, එය පෙරළා වෘත්තිකයින් මෙම අත්දැකීම්වලින් ඉගෙනීම වළක්වයි. මෙය පර්යේෂකයින්ට පමණක් නොව එවැනි ප්‍රයත්නයන් වෙනුවෙන් මුදල් යොදන ජාත්‍යන්තර ආධාරකරුවන් සහ ආයතනවලට ද අභියෝගයකි. ඉගෙනීම එවැනි සියලු ව්‍යාපෘතීන් තුළට නිසි ලෙස බද්ධ කිරීම සඳහා නව ක්‍රම ගැන සිතන්නට දැන් කාලයයි.

බොහෝ ක්‍රියාධරයින් මෙම පාඩම්වල ප්‍රතිඵල ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කරන්නට අසමත් වීමට තවත් හේතුවක් නම්, ඔවුන් විශාල වශයෙන් අභිලාෂ පිළිබඳ හැඟීම මගින් හසුරුවනු ලැබීමයි.

අවාසනාවකට, මෙම අභිලාෂ බෝහෝ විට සාමය ගොඩනැගීමේ ඉලක්කය සමග සමපාත වන්නේ නැත. උදාහරණයක් වශයෙන්, තමන් නියැළී සිටින නිශ්චිත ක්‍රියාවලිය සම්බන්ධයෙන් තමන් සාවද්‍ය ක්‍රියාධරයින් යැයි සමහර විට රාජ්‍ය නොවන සංවිධාන වටහාගන්නා නමුදු වෙන් කරන ලද මුදල වියදම් කිරීමට ඔවුනට අවශ්‍ය නිසා, ඔවුහු එහිම එල්ලී සිටිති. එමෙන්ම *පථ 1 හි* ක්‍රියාධරයෝ සමහරවිට නොබෙල් සාම ත්‍යාගය දිනා ගැනීමේ ආශාව විසින් මඩිනු ලබති! එවැනි ක්‍රියාධරයෝ සාමය ගොඩනැගීම සහ ගැටුම් ව්‍යාවර්තනය සඳහා නිර්මාණාත්මක දායකත්වයක් සැපයීමේ සිය ආරම්භක අරමුණෙන් පිට පැන මඟ වරද්දා ගනිති.

ඉහත සඳහන් සියලු කාරණා අර්ථදායී ආකාරයෙන් ඉටු කර ගත්තද, ප්‍රචණ්ඩ ගැටුම් වඩාත් සාර්ථක ලෙස සහ වේගවත්ව සාමකාමී තත්ත්වයක් බවට ව්‍යාවර්තනය වේ යැයි සහතිකයක් නැත. ගැටුම්වල සංකීර්ණතාව පමණක් නොව විශේෂයෙන්ම බාහිර ක්‍රියාධරයින් වශයෙන් මුහුණ දෙන පෞද්ගලික සීමාවන් ද අප නිතරම සිත්හි දරාගත යුතුය. අපගේ ක්‍රියාවන් වැඩි දියුණු කර ගැනීමට මහන්සියෙන් වැඩ කළ යුතු නැතැයි මෙයින් අදහස් කෙරෙන්නේ නැත. අනෙක් අතට, අවසානයේ දී ගැටුම් ව්‍යාවර්තනයේ ඵලදායී නීතිරීති තීන්දු කරන්නේ ගැටුම් ප්‍රදේශය තුළ සිටින අභ්‍යන්තර ක්‍රියාධරයින්ය යන්න අප කිසි විටෙක අමතක නොකළ යුතුය. කල් පවත්නා සාමයක් ගොඩනැගිය හැකි එකම ක්‍රියාධරයින් වන්නෝ ඔවුහුය.

## 4. ආශ්‍රිත ලේඛන සහ වැඩිදුර කියැවීම්




Bercovitch, J. 1992. *Mediation in International Relations*, London: MacMillan.

CAII 2000. *Conflict Prevention, A Guide*, online: http://www.caii-dc.com (accessed 9.10.2000).

Commission of the European Community 1993. *Manual: Project Cycle Management, An Integrated Approach and Logical Framework*, Brussels: European Community.

Erasmus, V. 2000. "Community Mobilisation as a Tool for Peacebuilding," *in* Paffenholz and Reychler, op. cit., 246–257.

Fisher, R. and L. Keashly 1991. "The Potential Complementarity of Mediation and Consultation within a Contingency Model of Third-Party Intervention," *Journal of Peace Research*, Vol. 28, No. 1, 29- 42.

Fitzduff, M. 2000. "First and Second Track Diplomacy in Northern Ireland," *in* Paffenholz and Reychler, op. cit., 110–120.

Information, Training and Development (ITAD) Ltd 1999. *Project Cycle Management Training Handbook*, Sussex: ITAD.

Kelman, H. 2000. "Intractable Conflict Resolution in the Middle East," *in* Paffenholz and Reychler, op. cit., 97-109.

Kleiboer, M. 1994. "Ripeness of Conflict: A Fruitful Notion?" *Journal of Peace Research*, Vol. 31, No.1, 109-116.

Kramer, G. 2001. "Zur Vermittlung und Entsendung ziviler Fachkräfte," *in* Zivile Konfliktbearbeitung. Eine internationale Herausforderung (Band 8 der Schriftenreihe des Österreichischen Studienzentrums für Frieden und Konfliktlösung), Münster: agenda Verlag.

Kruhonja, K. 2000. "Motivation and Qualifications," *in* Paffenholz and Reychler, op. cit., 21–28.

Krummenacher, H. and S. Schmeidl 1999. "FAST: An Integrated and Interactive Early Warning," *The Soviet and Post-Soviet Review*, Vol. 24, No.3, 147–159.

Lederach, J. P. 1997. *Building Peace: Sustainable Reconciliation in Divided Societies,* Washington, DC: United States Institute of Peace.

Lund, M. S. 1996. *Preventing Violent Conflict*, Washington, DC: United States Institute of Peace.

Lund, M. S. and A. Mehler 1999. *Peace-Building and Conflict Prevention in Development Countries. A Practical Guide,* Ebenhausen: CPN.

Mehler, A. and C. Ribeaux 1999. *Krisenprävention und Konfliktbearbeitung in der Technischen Zusammenarbeit* (Schriftenreihe der GTZ No. 269), Wiesbaden: Universum Verlagsanstalt.

Miall, H., O. Ramsbotham and T. Woodhouse 1999. *Contemporary Conflict Resolution: The Prevention, Management and Transformation of Deadly Conflicts*, Cambridge: Polity Press.

Mott Foundation 1999. *Reaching for Peace: Lessons Learned from the Mott Foundation*, Flint, MI: Charles Steward Mott Foundation.

OSCE, 2000. *Field of Expertise: General Minimum Requirements (Semi-final version)*, Vienna: OSCE Secretariat.

Paffenholz, T. 1998. *Konflikttransformation durch Vermittlung,* Mainz: M. Grünewald.

Paffenholz, T. 2000a. "Thirteen Characteristics of Successful Mediation in Mozambique," *in* Paffenholz and Reychler, op. cit., 121–127.

Paffenholz, T. 2000b. "Conclusions: Peacebuilding: A Comprehensive Learning Process," *in* Paffenholz and Reychler, op. cit., 535–545.

Paffenholz, T. 2001 (forthcoming). "Community-based Bottom-up Peacebuilding," *Horn of Africa Series*, Uppsala: Life and Peace Institute.

Paffenholz, T. and L. Reychler 2000. *Peacebuilding: A Field Guide*, Boulder, Co: Lynne Rienner Publishers.



Responding to Conflict 1999. *Working with Conflicts. Skills and Strategies for Action*, London: Zed Books.

Reychler, L. 2000. "Conceptual Framework," *in* Paffenholz and Reychler, op. cit., 3–16.

Smillie, I. and H. Helmich 1999. S*takeholders. Government-NGO Partnerships for International Development*, London: Earthscan.

Spelten, A. 1999. *Instrumente zur Erfassung von Konflikt- und Krisenpotentialen in Partnerländern der Entwicklungspolitik* (Forschungsberichte des BMZ, No. 126), Bonn: Weltforum Verlag.

Stedman, S. J. 1991. *Peacemaking in Civil War: International Mediation in Zimbabwe, 1974–1980,* Boulder, Co: Lynne Rienner Publishers.

Svensson, J. 2000. "Designing Training Programmes," *in* Paffenholz and Reychler, op. cit., 291–300.

Truger, A. 2000. "Training Peacebuilders and Peacekeepers,“*in* Paffenholz and Reychler, op. cit., 35-42.

Wehr, P. 1978. "Citizen Values and Forest Policymaking," *Western Sociological Review*, Vol. 9, No. 1, 39- 48.

Wehr, P. 1979. *Conflict Regulation*, Boulder, Co: Westview Press.

Wouters, J. 2000. "Training Humanitarian Aid Workers," *in* Paffenholz and Reychler, op. cit., 43–49.

Zartman, W. I. 1989. *Ripe for Resolution, Conflict and Intervenbtion in Africa,* New York, NY: Oxford University Press.